භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2020 ජූලි-අගෝස්තු 121 වන කාණ්ඩය - 04 කලාපය පිටු 32 Q/D/03/පුවත්/2020



## කොරෝනා වයිරසයෙන් දේව හඬ මතුවේද?

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

මිල රු.35/=
(සහන මිල)

# බුදුනේ ජේසුනේ නබිනායක තුමනේ

**ගී පද : මහාචාර්ය සුනිල් ආරියරත්න**
**සංගීතය : මර්වින් පෙරේරා**
**ගායනය : විශාරද නන්දා මාලිනී**

**පුන ගැයුම :**

**බුදුනේ ජේසුනේ නබිනායක තුමනේ**
**නොමිනිසුන් හට මිනිසත්කම දුන මැනවි**
**මිනිසුන් හට ප්‍රඥාව දුන මැනවි**
**ප්‍රඥාවන්තයන් සිංහාසනාරූඪ කළ මැනවි**

**අයුක්තියේ ඝන ශිලා තලා බිඳ (ගල් තලා)**
**විමුක්තියේ ජලධාරා මුදාහරිනු මැනවි**
**සිංහ වෙසින් එන සිගාලයින් (නරි)**
**වනසාලනු මැනවි**

**මිථ්‍යාවේ කළු වලා කඩා හැර**
**විද්‍යාවේ නව රේඛා උදා කරනු මැනවි**
**බැටළු වෙසින් එන ව්‍යාඝ්‍රයින්**
**හඳුනා දුන මැනවි**

නන්දා මාලනීයන්ගේ ඒ ගැඹුරු ඇතුළු ගැබෙන් නැඟෙන හඬ මොරගසමින් අයදින්නේ, සකල මානව වර්ගයාගේ යුගාන්තර ප්‍රාර්ථනාවයි. මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ සදය, උපහාසය දැඩිසේ ව්‍යංගාර්ථවත්ය. පුන ගැයුමේ ඇතුළරුත විවර වන්නේ කුමක්ද?

මේ යැදුම බුදුන් වහන්සේට, ජේසුස් වහන්සේට පමණක් නොව නබිනායක තුමන් ඇතුළු සකල ආගමික හා ප්‍රඥාවාදී පාර්ශ්වයන් වෙතයි.

පළමුව නොමිනිසුන් සේ සරන මිනිසුන් මිනිස්කමින් පුරවාලිය යුතු වන්නේය. එසේ වුවහොත් පමණි ප්‍රඥාව පහළ වන්නේ, එසේ පහළ ප්‍රඥාවෙන් සුසැදි මිනිසුන් සිංහාසනාරූඪ වූ කලක අවිද්‍යාව බිඳී යන්නේය.

ආලෝකයේ දොරටු විවර වන්නේය.

අසමතුලිතය බිඳී සාම්‍යය (සමානතාවය) ජනිත වන්නේය. මිනිස්සු ස්වෛරී වන්නෝය. නිදහස ජනිත වන්නේය. භීතිය පලා යන්නේය. එවන් වු සිහින රාජ්‍යයක පොරොන්දු දේශයක ප්‍රාර්ථනාව හුදු සිහිනයක්ම පමණක් වෙමින් පවතී. එහෙත් එළඹෙන සමය තීරණාත්මකය. බලලෝභී, මුග්ධ, අන්ධ, ධනලෝභී නොමිනිසුන් රජ කරනවාද? නැතහොත් කෙදිනක හෝ ක්‍රමිකව ගොඩ නැඟෙන නව රාජ්‍යයක ප්‍රාර්ථනාවෙන් අප පටු නොමිනිස් ගති හළා මිනිසුන් සේ සිතා ඉන් පහළවෙන ප්‍රඥාවෙන් අප තීරණ ගත යුතු නොවේද?

නොමිනිසුන් වු පාලකයන් පලවා හරින්නට නම් අප මිනිසුන් විය යුතුව ඇත.

ප්‍රඥාවන්තයන් සිංහාසනාරූඪ කිරීමට නම් අප ප්‍රඥාහරිත විය යුතුව ඇත.

**- සංජය නිර්මාල් -**



# භක්ති ප්‍රබෝධනය

2020 ජූලි-අගෝස්තු කලාපය


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කාර්යාලයීය සහාය**

දිනේෂා රණවක

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

සිසිර විජේතුංග ග්‍රැෆික්ස්

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08


## පිටුවෙන් පිටුව.........


**2** කවරයේ කථාව

**3** හෙළිදරව්ව

**5** නිමල මරිය නිකායේ නව ප්‍රාදේශාධිපති (කොළඹ ප්‍රාදේශිකය)
- ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**6** වසංගතයට පසු වසන්තය
- ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා

**8** අඳුරට සාප නොකර ඡන්දදායකයාගේ හෘදය සාක්ෂිය දල්වමු
- තරංගනී රෙසිකා

**9** කාටූනය - සී. අමිත

**10** මම අසමර්ථ වුවහොත් ඒ ගැන මම පසුතැවිලි නොවන බව දනිමි. එහෙත් මා පසුතැවිලි වියහැකි එකම දෙය වන්නේ උත්සාහ නොකිරීමයි. - ජෙෆ් බෙසෝස්
- ගරු මැක්සිමස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා

**11** හෙළයේ මැණිකක් වන්න
- සී. ආර්. ඩික්සන් ඇන්ටනි

**12** කොරෝනාව සහ ලාංකේය ජන සමාජ විකාශනය
- වෛද්‍ය සචිත මෙන්ඩිස්

**15** අපෙන් සමුගත් ගරු හිලරි පීරිස් නි.ම.නි. පියතුමා
- ටී. සුනිල් ප්‍රනාන්දු

**16** කොරෝනාව, ඉතාලිය සහ මනුස්සකම
- ගරු ශානිල් දිනුක ජයවර්ධන නි.ම.නි. පියතුමා

**19** ගරු පෝරුතොට පියතුමා හා භක්ති ප්‍රබෝධනය සබැඳියාව
- රූපස් ෆ්‍රැන්සිස්

**20** තෙවෙනි ඇස - කොවිඩ් 19 හා පරිසරය
- මහින්ද නාමල්

**22** අරුම විරාමය
- ගරු නිර්මිත සුරවීර නි.ම.නි. සහෝදරතුමා

**23** ඕං එහෙනං - ජෝසප් ඩයස්

**24** පුංචි විකුම් - සූරිය මාමා

**25** ප්‍රහේලිකා අංක 59
- ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

**26** අවිනිශ්චිත වර්තමානයක හා අනාගතයක ජීවත්වන් ඔබට... මට...
- නිහාල් සහ ශ්‍යාමලී යුවල

**28** කතෝලික ධර්මය, අ.පො.ස. (සා/පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2020
- ජේ.ඒ.එල්.එම්. ශ්‍රිමතී සිල්වා මෙනවිය


**30** ලක්දිව ක්‍රිස්තු ශාසනය (IX) / අ.පො.ස. (උ/පෙ.) ක්‍රිස්තියානි ධර්මය - ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි
- එස්. හේමාල් පෙරේරා

**32** ආයේ හෙට දවසක් තියේවිද අද වාගේ ?
- ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියනම

# භක්ති ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

දෙවියන් වහන්සේ විවිධ ආකාරයට අපට කථා කරන සේක. කථා කරන හැම වේලාවකම සවන් යොමු කරන අයට පමණක් ඒ හඬ ඇසිය හැකිය. හඬ අසන්නට සවන් දෙන මනසක් අත්‍යවශ්‍යය. සවන් දෙන්නට අප ඒ හඬට සුසර විය යුතුය (Tune). සුසර වන්නට ගතින්, මනසින්, හදවතින්ම අප සංසුන් වී ඒ හඬට සාංඝික විය යුතුය. සංසුන්ව සවන් දිය හැකි පරිසරයක් ඇති කර ගන්නට බාහිර නිහැඬිතාව වැදගත් සාධකයකි. ජනාකීර්ණ මාවතක්, බස් නැවතුම්පලක් හෝ මසුන් අලෙවි කරන වෙළඳපොළක් භාවනාවක් කරන්නට කිසිදු ආගමික බැතිමතෙක් තෝරා නොගනියි. එවැනි පරිසරයක් තුළින් ලබාගත හැකි ආධ්‍යාත්මික සුවය ඉතා අල්පය. බාහිර පරිසරය ඝෝෂාකාරී නොවන නිසංසල පරිසරයක් අභ්‍යන්තර නිශ්චලතාවක් නිර්මාණය කරගන්නට පැහැදිලිවම උපකාරී වේ. එවන් පරිසරයක් තුළ දැහැන් ගත වූ මේ තරුණයා හැම සිද්ධියක් තුළින් දෙවියන් වහන්සේ කථා කරන බව අවබෝධ කර ගනියි. පියවි ඇසට හා ආලෝක අණ්වීක්ෂයකට පවා නොපෙනෙන කිරීටයක් බඳු කොරෝනා වයිරසය හරහා සැබැවින්ම දේව හඬ ඉතා ගැඹුරු ලෙස උද්දීපනය විය. පරම අපරිමිත (unmeasurable) දේව හඬට දිනපතා සුසර වන්නට කවරයේ කථාව ඔබට මට ආරාධනා කරයි.

**ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු.500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

දායකත්වය සය මසකට - රු.250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
**භක්ති ප්‍රබෝධනය**
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 011 2698177
නව විද්‍යුත් තැපැල (ඊ-මේල්) :
**bhakthi.prabodhanaya@gmail.com**

## BHAKTHI PRABODHANAYA

**Local Subscription Rate.**

**Rs. 500.00 per year** (Including Postage)

**Rs. 250.00 per six months**
(Including Postage)

Letters, subscriptions and inquires should be addressed to:

Editor.
**"Bhakthi Prabodhanaya"**
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka.
Tel.: (94) 011-2698177
New Email: bhakthi.prabodhanaya@gmail.com

# කොරෝනා වයිරසයෙන් දේව හඬ මතුවේද ?

හෙළිදරව්ව

කාලයේ සලකුණු හරහා දේව හඬට අවදි වන්නට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව විශ්වාසකයන්ට ආරාධනා කරයි. දෙවියන් වහන්සේම නිර්මාණය කළ විශ්වය සහ විවිධ සමාජ සිද්ධි තුළින් උන්වහන්සේ අපට කථා කරන සේක. අවාසනාවකට බොහෝ දෙනෙක් එම හඬට සුසර වන්නට අපොහොසත්ය. එවැන්නන් මේ අවකාශය සහ කාලය (space & time) දකින්නේ සීමිත වපසරියක සිටය. තමන් ජීවත් වන යුගයට සහ ස්ථානයට කොටු නොවී අතීතය, වර්තමානය සහ අනාගතය එක්ව ගෙන පුළුල්ව අවබෝධ කර ගන්නට වෙර දරන්නා ප්‍රඥාවන්තයෙකි.

ස්වභාවධර්මයේ උත්තරීතර ජීවියා මිනිසා වුවද අනිකුත් ජීවීන් සහ අජීවීන් සමඟ සහජීවනයකින් තොරව මිනිසාට හුදෙකලාවේ ජීවත් විය නොහැකිය. අපේ ආදි මුතුන්මිත්තෝ, ඉරහඳ, ගහකොළ, සතා සිව්පාවා, ජලය ආදි ස්වභාවධර්මයේ සැලසුම සමඟ සහජීවනයෙන් කටයුතු කළහ. විටක ඒවා දේවත්වයෙන් පුදා ගෞරව කළහ. 1855 වකවානුව තුළ ජීවත් වූ රතු ඉන්දීය නායක සියැටල් එවකට ඇමරිකානු ජනාධිපතිව සිටි ජෙනරාල් ෆ්‍රෑන්ක්ලින් පියරිස් වෙත ලියන ලද ලිපියේ මහපොළව රතු මිනිසුන් ගේ මැණියන් වන අතර එහි අඩංගු හැම කොටසක්ම අති පරිශුද්ධ බැව් ප්‍රකාශ කරයි. එමෙන්ම දෙවියන් වහන්සේ මනුෂ්‍ය වර්ගයාගේ දෙවියන් වහන්සේ බවත් උන්වහන්සේගේ කරුණාව රතු මිනිසාටත් සුදු මිනිසාටත් එකසේ පවතින බවද පවසා ඇත.

අවාසනාවකට කාර්මික විප්ලවය, විද්‍යාවේ සහ නවීන තාක්ෂණයේ දියුණුවත් සමඟ දැනුමක් ලබන මනුෂ්‍යයෝ දෙවියන් වහන්සේව අමතක කිරීමට පටන් ගත්තා පමණක් නොව "දෙවියන් වහන්සේ මියගොස් ඇත" යන විකාර සිතුවිලිවලින් තමන්ගේ අහංකාරකම සහ උද්දච්චකම උද්දීපනය කළහ. එතැනින් නතර නොවී මැවුම්කරුවාණන්ට ගරහන ජනයා උන්වහන්සේගේ මැවීම හානි කරන්නේ කිසිදු පැකිලීමකින් තොරවය. ගංගා, සාගර, මහ පොළොව, වායුගෝලය ඇතුළු සොබාදහම විනාශ කරන්නට "සංවර්ධනය" යන සංකල්පවලට මුළාවී මිනිසා පෙලඹුනේය. කැළි කසළ, අපද්‍රව්‍ය ගංගා සහ මහ මුහුදට එක් කිරීමට පටන් ගත්තා පමණක් නොව මැටි, වැලි කපා ඉවුරු සහ ගංපතුල් විනාශ කරමින්, වනාන්තර කපමින් ආර්ථික ලාභ ලැබූහ. ජල පෝෂිත බිම් විනාශ කිරීම පමණක් නොව, වස විස දමමින් මහ පොළොව දූෂණය කළහ. ලාභ ලැබීම පමණක් ඒකායන පරමාර්ථය කරගෙන ශරීරයට අහිතකර, අගුණ, වසවිස ඇති ප්‍රමිතියෙන් තොර ආහාර නිෂ්පාදනයට යොමු වූහ. සොබාදහමට එරෙහිව යන කෘත්‍රිම ජීවිතයකට අනුගත වීමට ඇතැම් විට ජනමාධ්‍ය තුළින් ද වැඩි පන්නරයක් ලබා දුනි. ක්‍රමක්‍රමයෙන් මරණය කරා ගමන් කරවන පැවැතුම්වලට මිනිසා හුරු විය.

අධික මුදල් වැය කර, පවත්වන මංගල්‍යය, අවමංගල්‍යය හුදෙක් ආටෝපය පෙන්වන දහමේ වටිනාකම් ඉවත හෙළන, මානසික ආතතිය වැඩි කරන සෝෂාකාරී අවස්ථා ලෙස ව්‍යාප්ත වූයේ කොරෝනා වසංගතයටත් වඩා ශීඝ්‍රයෙනි. විශාල ලෙස ණය වෙමින් විවාහ මංගල උත්සව ගන්නා යුවල පසුව ආර්ථික අපහසුතා ඇති බව පවසමින් ඇතැම් විට දරුවන් එක්කෙනකුට හෝ දෙදෙනකුට සීමා කරති. තවත් විටක ලැබෙන්නට යන දරුවන් බියකින් චකිතයකින් තොරව ගබ්සා කරති. ක්ෂණික, කෘත්‍රිම ආහාර පාන ගන්නට දැඩි වුවමනාවක් ඇති නව පරපුරක් බිහිවීම නිසා දියවැඩියාව, කොලෙස්ටෙරෝල්, පිළිකාව වැනි බෝ නොවන රෝග, වැඩිහිටි පරපුර තුළ පමණක් නොව, භද්‍ර යෞවනය ගත කරන අය තුළ පවා ප්‍රචලිතය. ක්‍රීඩාව, ශාරීරික ව්‍යායාම, නිසි විනෝදය, නිදහස ඇහිරීයාම නිසා පැමිණෙන අභියෝගවලට නිසි අයුරින් මුහුණ දෙන්නට නොහැකිව මානසික ආතතිය දෙගුණ තෙගුණ වී සුපිපෙන මලක් වූ නව යෞවන ජීවිතය තමන් විසින්ම මිලාන කරගත් අවස්ථා ගණන අද වැඩි වෙමින් පවතී.

ඉහත සඳහන් කළ සියල්ල සොබාදහමේ න්‍යාය පත්‍රයට එරෙහිව අප ගමන් කළ අවස්ථාය. කොරෝනා වයිරසය මනුෂ්‍යයාව ගොදුරු කරගත්තේ

මෙවන් පසුබිමකය. එය අද වන විට මිනිසුන් ලක්ෂ ගණනකගේ ජීවිත බිලි ගනිමින් සිටියි. ඒ නිසා මෙතුවක් අප කරගෙන ආ චර්යා රටා, ආහාර රටා, සිතුම් පැතුම් වෙනස් වන්නට වුවමනා බව අද බොහෝ දෙනෙක් තේරුම් ගනිමින් සිටිති. මෙවන් වූ සන්දර්භයක ජීවත් වන ඔබට මට කොරෝනා වයිරසය හරහා මතු කරන දේව හඬ ඇත්තෙන්ම කුමක්ද?

කෙනෙක් දෙවියන් වහන්සේව පිළිගැනීමට අකමැති වුවද, උන්වහන්සේ මවන ලද සියල්ලේ සැලැස්ම කිසිවකුට වෙනස් කරන්නට හෝ අවුල් කරන්නට බැරි බව කොරෝනා වයිරසය හරහා නොපවසයිද? ස්වභාවධර්මයේ ක්‍රියාවලිය විනාශ කරන්නාට සහ විකෘත කරන්නාට ස්වභාවධර්මයම පාඩම් උගන්වමින් මිනිසාව අභියෝගයට ලක් කර ඇති බව දෙවියන් වහන්සේ අපට නොපෙන්වයිද? ස්වභාවධර්මය උගන්වන පාඩම ප්‍රතික්ෂේප කරන අය පමණක් නොව සමස්ත ජන සමාජයක් වුවද විනාශයට ගමන් කරන බවද මතු කරන තවත් දේව හඬකි. දෙවියන් වහන්සේගේ හඬට සුසර නොවී තමන්ගේ වාසියට, ලාභයට, කීර්තිනාමයට, දේශපාලන න්‍යාය පත්‍රයට පමණක් කොටු වී, ධර්ම මාර්ග විකෘත කරමින් දහම පවා විකුණා තම බලය, ධනය, තනතුරු ආරක්ෂා කරගන්නට අහිංසක අසරණ ජනතාව ඇපයට තබන පුද්ගලයන්ට එලෙස නොකරන ලෙස සමිඳාණන් වහන්සේ පවසන බව මෙයින් ගම්‍ය නොවන්නේද?

**නපුරා ඇතුළු නපුරාගේ ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීමට උත්සුක වන ජනයාට වඩා දේව හඬ ඔස්සේ ගමන් කරන ජනතාවගේ දැඩි නිහැඬියාව කිතුනු කැඳවීමට පටහැනි බව කොරෝනා වසංගතය තුළින් පිළිබිඹු වන දේව හඬ නොවේද?**

## පාඨක ඔබ වෙත කාරුණිකව දැනුම් දෙමු

- නොසිතූ මොහොතක ඇතිවූ කොරෝනා වයිරසය නිසා භක්ති ප්‍රබෝධනය මැයි, ජූනි කලාප ඔබ අතට පත් කිරීමට නොහැකිවීම ගැන කණගාටු වෙමු.
- එමෙන්ම අප කලින් සැලසුම් කර තිබූ තේමාවෙන් බැහැරවන්නට සිදුවූයේ වර්තමාන පසුබිම තුළය. කෙසේවෙතත් ඔබ අප වෙත එවන ලද ලිපි අවස්ථාවන්ට අනුකූලව ඉදිරි භක්ති ප්‍රබෝධන කලාපවල ඉඩකඩ තිබෙන ආකාරයට තෝරගත් ලිපි පළකරන්නට බලාපොරොත්තු වෙමු.
- විශේෂයෙන් දායක මුදල් දී ඇති පාඨකයන්ට ඔබ දුන් මුදල් ආවරණය වනතෙක් ඔබට ඉදිරියේදී භක්ති ප්‍රබෝධන කලාප ලැබෙන බවද මතක් කරමු.
- ඔබගේ පිටපත නොලැබී ඇතිනම් කරුණාකර පහත අංකයට දුරකතන ඇමතුමක් දී හෝ ලිපියකින් දැනුම් දෙන්න - 071-8415549 / 011-2698177
- ලබන කලාපයේ සිට පාඨක හඬ නමින් තීරයක් ආරම්භ කරන්නට අපි සූදානම් වෙමු.
- සඟරාව සම්බන්ධයෙන් ඔබගේ අදහස් සහ භක්ති ප්‍රබෝධනයේ අභිවෘද්ධිය සඳහා කිසියම් විවේචනයක් කළ යුතුනම් එය ඉතා සැකෙවින් අප වෙත ලියා එවන්න. ඉඩකඩ ඇති අයුරින් ඒවා පළ කිරීමට බලාපොරොත්තු වෙමු.

**- ඔබගේ කාරුණික අවධානයට -**

මෙහි පළවන නිර්මාණ කර්තෘවරුන්ගේ අයිතියක් සහ බුද්ධිමය දේපලක් වන බැවින් එම නිර්මාණ ඔවුන්ගේ නිසි අවසරයකින් තොරව අලෙවි කිරීම සඳහා උපුටා ගැනීම, ඡායා පිටපත් කිරීම, ප්‍රසිද්ධ කිරීම, වෙනස් කිරීම නොකළ යුතුය. එය නීති විරෝධි කටයුත්තක් බැවින් එවැනි නීති විරෝධි කටයුත්තකදී කර්තෘවරයාගේ අයිතිය වෙනුවෙන් භක්ති ප්‍රබෝධනය පෙනී සිටියි.

**සංස්කාරක**

# නිමල මරිය නිකායේ නව ප්‍රාදේශාධිපති

## (කොළඹ ප්‍රාදේශිකය)



සග සුව ලැබූ එම්. තිමෝති සිල්වා සහ ඩබ්ලිව්. ග්‍රේස් ප්‍රනාන්දු යුවලගේ ආදරණීය පුත් අතිගරු රොෂාන් ජුඩ් ලක්ෂ්මන් සිල්වා නි.ම.නි. පියතුමා වැඩිමහල් සහෝදරයන් දෙදෙනකුගේ සහ සහෝදරියකගේ පවුලේ බාලයා ය. ක්‍රි.ව. 1964 අප්‍රේල් 02 දින කොටුගොඩ ග්‍රාමයේ මෙතුමා උපත ලැබීය. මීගමුව මාරිස්ටෙල්ලා විදුහලින් අධ්‍යාපනය ලබා පසුව කොහුවල සා. ජෝසප් නිර්මල මරිය නිකායේ කනිටු දෙව්සත්හලට ඇතුළු වී බම්බලපිටිය සා. පීතර විදුහලින් තම මූලික අධ්‍යාපනය රොෂාන් පූජක සිසුවා හමාර කළේය. 1986 සැප්තැම්බර් මස 08 වන දින නිර්මල නිකායේ පැවිදි ජීවිතය ආරම්භ කර, 1991 සැප්තැම්බර් 28 වන දින අවසාන වේදහාර ලබා, 1992 අගෝස්තු මස 22 වන දින කොළඹ මරදාන පාතිමා දෙව්මැදුරේදී, ස්වර්ගස්ථ වූ අති උතුම් ෆ්‍රැන්ක් මාකස් හිමිපාණන්ගේ දෑතින් මෙතුමා පුදැදුරු වරම් ලැබීය. මිනුවන්ගොඩ පොල්වත්ත 'දෙව් අරණින් ' දේශනාවාදී පියතුමකු ලෙස තම පූජක ජීවිතය අරඹා බණ්ඩාරවෙල ආධුනික දෙව්සත්හලේ සහායක පියතුමකු, අම්පිටිය ජාතික දෙව්සත්හලේ කථිකාචාර්යවරයකු සහ නි.ම.නි. දෙව්සත්හලේ ආචාර්ය මඩුල්ලේ සේවය කර වර්ෂ 2001 දී රෝමයේ ග්‍රෙගෝරියන් විශ්වවිද්‍යාලයට උසස් අධ්‍යාපනය සඳහා ඇතුළත් විය. පසුව 2003 සිට බුත්තල 'සුබසෙත් ගෙදර' අධ්‍යක්ෂ පියතුමා ලෙසත් 2009 සිට බණ්ඩාරවෙල නි.ම.නි. ආධුනික දෙව්සත්හලේ ප්‍රධාන පියතුමා ලෙසද, 2017 සිට මග්ගොන සාන්ත විසෙන්ති ආයතනයේ අධ්‍යක්ෂ පියතුමා ලෙසත් සේවය කළේය. පසුගිය මැයි මාසයේ 21 වනදා නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපති ලෙස අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා පදවි ප්‍රාප්ත විය.

සේවක නායකත්වයේ ක්‍රිස්තු අනුගාමිකයකු ලෙස තම උපදේශන කමිටුවේ සාමාජිකයන් වන ගරු ඩිලාන් පෙරේරා, ගරු ජගත් ඇන්තනි, ගරු ක්‍රිස්ටි සිල්වා, ගරු ජෝසප් රොෂාන් ප්‍රනාන්දු සහ ගරු ශිවන්ත වාස් යන නි.ම.නි. පියතුමන්ලා සමඟ තම දූත සේවාව දියත් කරන්නට දේව ආශීර්වාදය නොමඳව ලැබීමට දෙවිඳුන් යදිමු.

භක්ති ප්‍රබෝධනය සඟරාව, අතීත ආවර්ජනයකට ලක් කරන විට, අප මතකයට නැගෙන්නේ වර්ෂ 2009 සිට 2013 දක්වා පුරා වසර පහක් අඛණ්ඩව භක්ති ප්‍රබෝධනය සඟරාවේ 'වසන්ත සඳැල්ල' නමින් තාරුණ්‍යය අමතමින්, අතිගරු රොෂාන් සිල්වා පියතුමා අතින් ලියවුණු අනර්ඝ ලිපි පෙළය. ඒ නිර්මාණ සියල්ලම අගයමින් භක්ති ප්‍රබෝධනය සහෘදයන් වෙනුවෙන් අපගේ කෘතවේදිත්වය මෙලෙස සටහන් කරමු.

පුරා වසර තුනක් නිර්මල මරිය නිකායේ ප්‍රාදේශධිපති ලෙස කටයුතු කළ ගරු අර්වින්. එච්. මොරායස් නි.ම.නි. පියතුමා ඇතුළු එතුමන්ගේ උපදේශන කමිටුවේ සියලු පියතුමන්ලාට හද බැතියෙන් භක්ති ප්‍රබෝධනය පාඨකයන් ඇතුළු කාර්ය මණ්ඩලය වෙනුවෙන් කෘතවේදී වෙමු. ඔබ සැමගේ සියලු වැඩ කටයුතුවලට දේව ආශිර්වාදය ප්‍රාර්ථනා කරමු.

**ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

# වසංගතයට පසු වසන්තය

**ප්‍රවේශය**

කෝවිඩ් 19 ලොව සලිත කරලීය. මිලියන ගණනක් රෝගී වී ලක්ෂ ගණනක් මිය ගොස් ලක්ෂ ගණනක් සුවපත් වී ඇත. දේව ගතියෙන් ඉටුවන වෙද හෙදකම හෙම්බත් වී ඇත. පොලීසිය සහ ත්‍රිවිධ හමුදා ගිනි අවි රහිත යුද්ධයකට යොමු වී මිනිසුන්ගේ ආතතිය නැති කිරීමට සංගීත සංදර්ශන පවත්වන සහ ගොවියන්ගේ එළවලු මිලට ගෙන, බෙදා හරින වෙළඳ නියෝජිතයන් වී ඇත. සංස්ථාගත ආගම වික්ෂිප්ත කර නව ආරක ඇදහිල්ලකට සහ සදාචාරයකට මිනිසුන් යොමු වී ඇත. දේශපාලන නායකත්වය පක්ෂග්‍රාහීවීම අභියෝගයට ලක් වී ජාතිය, ආගම, භාෂාව, වර්ණය, කුලය අතික්‍රමණය කරන ජාතික නායකත්වයකට ඇබැර්තු සැකසී ඇත. සුපිරි ආර්ථික සැලසුම් පසුපස දිවගිය සුනඛ හතිය හිටි අඩියේ නැවතී මිනිස්කමට හරස්වූ තාක්ෂණයේ අධි ප්‍රගතිය හෝඩියේ පන්තියට බාල්දු කර ඇත. කාර්ය බහුලබවේ අධි මානසිකත්වයට විරාමයක් තබා ජීවිතය මන්දචාලක වී ඇත. එහෙත් මේ සා විශාල වෙනසක් කළ කෝවිඩ් 19 ද වැඩිකල් නොගොස් ඉතිහාසයේ තවත් අඳුරු ලක්ෂ්‍යයක් පමණක් වනු ඇත. අපට එය ද අමතකවනු ඇත.

**ඉනික්බිති සිදුවන්නේ කුමක් ද?**

ඉක්මනින් ආතතිය නැති වී අපහසුතාව මඟ හැරී නැවත ජීවිතයේ මන්ද මානසික සුනඛ වේග දිවීමේ ඉසව්වට මිනිසුන් සැරසෙනු ඇත. සියල්ල ආදි වූවාක් මෙන් දූනුත් නිතිපතාත් වනු ඇත. එබැවින් මෙය නිමවන්නට පෙර මඳක් නැවතී හොඳින් සිතමු. කෝවිඩ් 19, මට ඔබට අපට කියා දුන්නේ කුමක් ද? ඒ පාඩම් ගණනින් බොහෝ බව නම් දූන් අපි දනිමු. ඒ ගැන අපි සතුටු වී මෙය සැඟවුණු ආශීර්වාදයක් බව ද කියන්නට එඩිතර වෙමු. එහෙත් මේ පාඩම් නිසා මම වෙනස් වන්නෙමි ද? ඔබ වෙනස් වන්නෙහි ද? අපි වෙනස් වෙමු ද?

අතීතය දෙස මඳක් බලමු. මෙවැනි ගෝලීය වසංගත මීට පෙර අවස්ථා ගණනාවකම ලෝකයේ සිදු වී තිබේ. ක්‍රිස්තු පූර්ව සහ ක්‍රිස්තු වර්ෂවල සිදු වූ මේ වසංගත නිසා ලක්ෂ ගණන් මිලියන ගණන් මිනිසුන් මියැදී බොහෝ විනාශ සිදු වී ඇත. උදාහරණ ලෙස 1346 සිට 1353 දක්වා ආසියාවෙන් ආරම්භ වී යුරෝපයට ගොස් එහි ජනගහනය අඩකින් මෙන් විනාශ කළ කහඋණ වසංගතය, මිලියන 500 පමණ ජීවිත නැති කළ 1918 සිට 1920 දක්වා පැවති ස්පාඤ්ඤ උණ (එය ස්පාඤ්ඤයේ ආරම්භ වූයේ නැත) වසංගතය, මිලියනයකට වඩා වැඩි ජීවිත ගණනක් බිලිගත් 1957 සිට 1958 දක්වා පැවති ආසියානු උණ වසංගතය, 2009 සිට 2010 දක්වා පැවති සූකර උණ වසංගතය, 2014 සිට 2016 දක්වා පැවති ඉබෝලා උණ වසංගතය වැනි බොහෝ උවදුරු සිහි කරමු. ඒවායින් පසුව සිදුවූයේ කුමක් ද? මිනිස්සු වෙනස් වූවෝ ද? වඩා යහපත් වූවෝ ද ? තවත් නරක තත්ත්වයකට පත්වූවෝ ද? බොහෝවිට නිවැරදි උත්තරය අවසාන උත්තරය. යම් වෙනස්කම් සිදුවුව ද බොහෝ විට සිදුවූයේ ඉක්මනින් සියල්ල අමතක වී මිනිසා යළි පරණ සදාචාර විරෝධී ජීවියා ලෙසම ගමන් ඇරඹීම මිස නවෝදයක් ඇතිවීම නොවේ. ඇත්තෙන්ම ඇතැම් තැන්වල තිබුණාටත් වඩා තත්ත්වය නරක අතට හැරුණි. ඒ නිසා මේ අවස්ථාවේදී මේ ගෝලීය වසංගතය පහව යාමට පෙර අපි සිතමු. අවම වශයෙන් මේ අවස්ථාවේදී වත් වඩා යහපත් වෙනස්කම් සිදුවිය යුතු බව තරයේ විශ්වාස කර සාධනීය වෙනස්කම්වලට පරිත්‍යාගශීලීව සහ පරාර්ථකාමීව ඉඩ දෙන්නට සපුරාම වෙර දරමු.

වසංගතයට පසු වසන්තය නමින් දිග හැරෙන මේ කෙටි මෙනෙහි කිරීම් කිහිපය තුළින් අපේක්ෂා කෙරෙන්නේ පියවරෙන් පියවර මේ වෙනස්කම් සැකෙවින් මෙනෙහි කිරීමයි.

**මෙහි පියවර මෙසේ දිග හැරෙනු ඇත.**

1. මම වෙනස් වෙමි.
2. අපේ පවුලේ සියලුදෙනා වෙනස් වනු ඇත.

3. අපේ ආගමික සිද්ධස්ථානයේ නවතාවක් අත් දකිමු.
4. අපේ ගමේ සියලුදෙනා වෙනස් වනු ඇත.
5. අපේ පාසැල් දරු දැරියන් වෙනස් වනු ඇත.
6. අපේ දේශපාලන නායකත්වය වෙනස් වනු ඇත.
7. අපේ ගෝලීය නෑකම් වෙනස් වනු ඇත.
8. ප්‍රගතිය පිළිබඳ අපේ ආකල්ප වෙනස් වනු ඇත.
9. පරිසරය පිළිබඳ අපේ ආකල්ප වෙනස් වනු ඇත.

**පළමු මෙනෙහි කිරීම - මම වෙනස් වෙමි**

**"හැම කෙනකුම සිතන්නේ ලෝකය වෙනස් කිරීමටය. එහෙත් තමන් වෙනස් විය යුතු බව කිසිවකු සිතන්නේ නැත." - ලියෝ ටෝල්ස්ටෝයි**

**"බොහෝ දෙනාට අවශ්‍යව ඇත්තේ තමන්ගේ ජීවිතය වඩා උසස් කර ගැනීම පිණිස ලෝකය වෙනස් කිරීමටය. එහෙත් වෙනස් විය යුතු පළමු ලෝකය ඇත්තේ ඔවුන් තුළය."** - ඇමරිකානු ග්‍රන්ථ කර්තෘ **ජෝන් සී මැක්ස්වල්.**

**"මට ලෝකය වෙනස් කිරීමට නොහැකි වුවද බොහෝ රැළි නංවන සේ වතුර හරහා ගලක් විසි කිරීමට මට හැකිය." - සාන්ත තෙරේසා මව්තුමිය**

**මා තුළ මට වෙනස් කර ගත හැකි වන්නේ මොනවා ද?**

මගේ වගකීම් විරහිත ක්‍රියාවන් අන් අයටත් විපත් ගෙන දිය හැකි නිසා හැම ක්‍රියාවක්ම බුද්ධිමත්ව හොඳින් සිතා බලා ක්‍රියාවට නැංවීමට මම පෙරට වඩා අධිෂ්ඨානපූර්වක විය යුතු නොවෙම් ද? උදාහරණ ලෙස කිසියම් හෙයකින් ආසාදිත තත්ත්වයක් පිළිබඳ සැකයක් ඇත්නම් එය සඟවා සිටීම නිසා මා ආ ගිය තැන්වල අන් අයටත් එය බරපතළ ලෙස බලපෑ හැකි බව අවබෝධකර ගැනීම වැදගත් බව මම දන්නෙම් ද? එවැනි තත්ත්වයක් ඇත්නම් තැන් තැන්වල නොගොස් හැකි වහා ම වෛද්‍ය පිහිට පැතිය යුතු නොවේ ද? **මේ ලෝකය මා සඳහා පමණක් නොවන බව අවබෝධ කර ගැනීම දැන් මට පෙරට වඩා අවබෝධ විය යුතුය. මෙහි සම්පත් සීමිත බැවින් ඇති හැකි අය අතරේ පමණක් බෙදී යාම අසාධාරණ බව අවබෝධ කරගෙන වඩා පරිත්‍යාගශීලීව සහ සාධාරණව කටයුතු කළ යුතු බව මම අවබෝධ කර ගත යුතු වෙමි.**

පාරිසරික සම්පත් සූරා කෑමෙන් වැළකීමට සහ අන් අය වළකාලීමට මට කළ හැකි දේ මොනවාද? මගේ රැකියාව නිසා මා වුවමනාවට වඩා මේ පරිසරයට හානි කරන කෙනෙක් ද? මගේ දේශපාලනික බලය හෝ ධනය හෝ භාවිත කර පරිසරය විනාශ කරමින් අයථා ලෙස මුදල් රැස්කරන කෙනෙක් ද? මගේ ශරීර සෞඛ්‍යය නිසි ආකාරයෙන් ආරක්ෂා කර ගැනීම අන් අයගේ ශරීර සෞඛ්‍යයටද හිතකර බව මට වැටහෙනවාද? අනාගතයේ තවත් මෙවැනි තත්ත්ව ඇතිවීම වළකාලනු පිණිස මට කළ හැකි ඉතා අල්ප දේ කරන්නට වෙර දැරීම මේ මොහොතේ මගේ අධිෂ්ඨානය විය යුතුය. **පොදු ස්ථානවල මගේ හැසිරීම ගැන මම පෙරට වඩා සැලකිලිමත් වෙමි. අපේ ගෙදර අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී පොදු වාහනවල ගමන් කිරීමේ දී, කෙළ ගැසීමේ දී, කිවිසීමේ දී, සමාජ දූරස්ථභාවය ආරක්ෂා කිරීමේ දී, මුහුණු ආවරණ පැළඳීමේ දී වැනි අවස්ථාවලදී මම මීට වඩා පරිස්සමින් සහ වගකීමෙන් වැඩ කටයුතු කළ යුතු වෙමි.**

මේ දවස්වල අත් සෝද ගන්න මං පුරුදු වුණා. හැබැයි ටික දවසකින් ඒකත් අමතක වෙයි ද? මගේ හැකියාව සහ බලපුළුවන්කාරකම ගැන මහාප්‍රාණයෙන් කතා කිරීම වෙනුවට මා ලද දේ වෙනුවෙන් සහ මේ ලෝකය වෙනුවෙන් දෙවියන්ට ස්තුති කිරීමට අමතක කරන්න බැහැ. මේ මාස කිහිපය අමතක නොකරන්නට මම අධිෂ්ඨානය කරන්නෙමි. එය හුදු සැමරුමක් පමණක් කර ගන්නේ නැතිව ඉන් මා උගත පාඩම් නිතර සිහිපත් කරමින් ඒවා මා ජීවත් කරන්නේ ද යන්න විමසා බැලීම වැදගත් බව මම අවබෝධ කරගන්නෙමි. තමා සම්මතේ පිහිටා සිටීමෙන් අනතුරුව හැකි අයුරින් නිවැරදි දේ කරන්නට අන් අයටත් ඇරියුම් කිරීම වඩා ඵලදායී බව ද අවබෝධයට ගනිමි.

19 වන පිටුවට.....

**ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා,**
අධියුරු, "දහම් සෙවණ", දෙවිසත්හල, කළුතර.

# අඳුරට සාප නොකර ඡන්දදායකයාගේ හෘදය සාක්ෂිය දල්වමු.

''මේ සැරේ නම් කාටවත් ඡන්දෙ දෙන්නෙ නෑ. ඔක්කොම කරන්නෙ බොරුව, වංචාව, ගසා කෑම, අසාධාරණේ. පොඩි මිනිහා ගැන සලකන එක දේශපාලනඥයෙක්වත් නෑ. රට විකුණල හරි කමක් නෑ උන්ට ඕන තමන්ගෙ සේප්පු පුරවගන්න.''

''හොඳයි ඉතින් ඡන්දෙ නොදී හිටියා කියමුකො. එතකොට මොකද වෙන්නෙ පාර්ලිමේන්තුවම හොරුන්ගෙන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ගෙන්, දූෂකයන්ගෙන්, මදාවිකාරයන්ගෙන් පිරෙයි. තත්ත්වෙ තවත් නරක් වෙන එක නෙමෙයිද වෙන්නෙ.''

''හා ඉතින් කියමුකො බලන්න අවංකව ඡන්දයක් දෙන්න පුළුවන් එකම එක නියෝජිතයෙක්වත් ඉන්නවද කියලා, එකම එක පක්ෂයක් කියන්න බලන්න රට ගැනයි, මිනිස්සු ගැනයි හිතන.''

''නපුර වැඩියි ඇත්ත... නමුත් මේ තියෙන තත්ත්වය ඇතුළෙ අපට අවම නපුර ගැනවත් හිතන්න වෙනවා. **හොඳට ඇහැ කන ඇරලා බැලුවොත් මේ කුණු වුණ දේශපාලනය ඇතුළෙත් තාමත් බලාපොරොත්තුවක් තියාගන්න පුළුවන් මිනිස්සු ඉන්න බව පෙනෙයි.** එහෙම නැත්නම් අපි එවැනි මිනිස්සු දේශපාලනයට එන විදියට වැඩ කරන්න ඕන. බලය දූෂිතයි, පරම බලය අතිශය දූෂිතයි කියල කතාවක් තියෙනවනේ. ඉතින් නොමිනිසුන් අතට මහා බලයක් නොයන විදියට තමන්ගෙ කතිරෙ පාවිච්චි කරන එකත් මේ මොහොතෙ පුරවැසියන් විදියට අපේ වගකීමක්. ඒකට තමයි පුරවැසි දේශපාලනය කියන්නෙ.''

''හ්ම්... හ්ම්''

''දේශපාලනය කියන්නෙ උත්තරීතර වැඩක්. රටක, ජන සමාජයක යහපත වෙනුවෙන් තීන්දු තීරණ ගන්න, ඒවා ක්‍රියාත්මක කරන්න විනිවිදබැලීමකින් යුතු වැඩපිළිවෙලක් හැදීමනෙ, දේශපාලනයේ සැබෑ අරමුණ විය යුත්තෙ. එතන පටු අරමුණු තියෙන්න බෑ. පීඩිත පන්තිය අමතක කරලා තමන්ගේ සුබ විහරණය ගැන විතරක් හිතන්න බෑ. හැමදෙනාටම යහපත සැලසෙන වැඩපිළිවෙලක් තියෙන්න ඕන. හරි අධ්‍යාත්මයක්, හෘදය සාක්ෂියක්, නිවැරදි දැක්මක් නැති මිනිස්සුන්ට මේක කරන්න බෑ. අද මේ දේශපාලනය කියල කරන්නෙ සීමිත පිරිසක් අත ආර්ථික බලය පවත්වාගන්න පොඩි මිනිහගෙ ඇස් වහල කරන ඇස්බැන්දුම් වැඩක්නෙ.''

''මේ රටට නිදහස ලැබිල අවුරුදු හැත්තෑවක් ගියත් අපට ඔය තියෙන මජර දේශපාලන ක්‍රමය නවත්වන්න බැරිවුණානේ.''

''එහෙම හිතුවොත් නම් කලකිරීමක් විතරයි ඉතුරු වෙන්නෙ. නමුත් ජනතාව වෙනස් වෙනව නම් මේ ක්‍රමය වෙනස් කරන්න පුළුවන්. ඒකට අපි හිතන පතන විදිය සහ වැඩ කරන විදිය වෙනස් වෙන්න ඕන.''

''ඒ කොහොමද?''

''මුලින්ම, අපි ආසන්න පාර්ලිමේන්තු මැතිවරණය ගැන හිතමු. මෙතනදි අපි ඡන්දය පාවිච්චි කරන්න ඕන අපේ පෞද්ගලික වාසිය ගැනවත්, ජාතිය, ආගම හරි, පුද්ගල ජනප්‍රියත්වය හරි, පාරම්පරික පක්ෂය ගැන හරි හිතල නෙවෙයි. පොදුවේ ගමට, රටට අවම යහපතක් හරි ඉටුවෙයි කියල හිතන්න පුළුවන් පුද්ගලයා ගැන හිතලා. දැන උගත්, යහපත් මිනිස්සු පාර්ලිමේන්තු යවන්න අපි මහන්සි ගන්න ඕන. අනිත් කාරණේ තමයි නිවැරදි දැක්මක පිහිටන ශක්තිමත් විපක්ෂයක් ඕන රටකට. බලය යහපත් මිනිසුන් අතට බාරදෙන්න මේ මොහොතෙ අපට පුළුවන්කමක් නැත්නම් ප්‍රබල විපක්ෂයක්වත් හදන්න අපි මහන්සි වෙන්න ඕන. ඇලි මැලි දුබල විපක්ෂයක් නෙවෙයි අවම වශයෙන් පාර්ලිමේන්තුව ඇතුළෙ මිනිස්සු වෙනුවෙන් හඬක් නගන්න පුළුවන් විපක්ෂයක්.''

''ඒ කතාව ඇත්ත, ඒත් ඕවා තාවකාලික පැලැස්තරනේ''

''ඔව්, ඇත්ත, ක්ෂණික නූඩ්ල්ස් හදනවා වගේ දේශපාලන ක්‍රමයක් වෙනස් කරන්න බෑ. ඒකට ජනතාව දැනුවත් කරන්න ඕන. ඒක බිම් මට්ටමින් පටන් ගන්න ඕන වැඩක්. කුඩා කණ්ඩායම් විදියට දැනුවත්කිරීම් කරන්න ඕන. දේශපාලනය කියන්නෙ පුරවැසි වගකීමක් කියන එක

හැමදෙනාම තේරුම් ගත්ත දවසට තමයි මේ ක්‍රමයේ වෙනසක් දකින්න පුළුවන් වෙන්නෙ. සල්ලි විසිකරලා, මදාවිකම් කරලා අන්ත දූෂිතයන්ට බලයට එන්න පුළුවන් වෙලා තියෙන්නෙ, උන්ට ඡන්දෙ දෙන පිරිසක් මේ සමාජයේ ඉන්න නිසානෙ. අන්න එතැනයි අපි වෙනස් කරන්න ඕන. හෘදය සාක්ෂියක් ඇති මිනිස්සු හරියට කතිරෙ ගහන්න ඉගෙනගත්තු දවසට ගොඩක් දේවල් වෙනස් වෙයි.''

''මිනිස්සු හැමදාමත් රැවටෙනවා. ඉතින් කොහොමද වෙනසක් කරන්නෙ?''

''රැවටෙන්නෙ මිනිස්සු ඇත්ත දන්නෙ නැති නිසා. ඇත්ත සමාජ ප්‍රශ්න ගැන මිනිස්සුන්ට දැනීමක් නැහැ. තමන්ව පීඩාවට පත්වෙන්නෙ කොහොමද කියන එක, ඒ පීඩාවේ මූලය තියෙන්නෙ කොතනද කියන එක මිනිස්සු දන්නෙ නෑ. ඒ ඇත්ත, දේශපාලකයොත්, මාධ්‍යයත් මිනිස්සුන්ගෙන් හංගනවා. අපි ඒ ඇත්ත මිනිස්සුන්ට ඇහෙන්න, දැනෙන්න කියන්න ඕනි. දේශපාලකයා තමන්ගේ වාසිය වෙනුවෙන් ජාති, ආගම්, කුල, පක්ෂ ආදි නොයෙක් විදියට අපිව භේදබින්න කරන බව ජනතාව දැනගන්න ඕන. ඒ දැනුවත්කම සමාජය තුළ ගොඩනැගීම අත්‍යවශ්‍ය කාරණයක්.''


''අපේ තරුණ පරපුර? අලුත් ඡන්ද? එයාලගෙ කතිරෙ තීරණාත්මකයි නේද?''

''හ්ම්, ඒක තමයි කණගාටුවට කරුණ, අද තරුණ පරපුරට නිවැරදි නායකත්වයක් නැහැ. සමාජ මාධ්‍ය තමයි ඒ ඔලුගෙඩි පාලනය කරන්නෙ. බහුතරයක් ජාතිවාදී, ආගම්වාදී විස පුරවගෙන වල්මත් වෙලා. අපි කොතනින්ද පටන්ගන්න ඕන. දෙවෙනි ලෝක යුද්දෙන් පස්සෙ ජපානය තමන්ගෙ රට ගොඩනගන්න තීරණය කරද්දි එයාල පටන්ගන්නවා රන් බිජුවට කියලා ව්‍යාපෘතියක්. එයාල සමාජය ගොඩනගන වැඩේ පටන්ගත්තෙ පෙර පාසලේ දරුවන්ගෙන්. අදත් අපිට එතන ඉඳන්ම වැඩ පටන්ගන්න සිද්ධවෙලා තියෙනවා. ජනතාව ආත්මාර්ථකාමී නම්, තණ්හාධික නම්, නූගත් නම්, අපිළිවෙළ නම් එවැනි ජනතාවක් අතරින් අපට සුපිරිසිදු දේශපාලනයක් බලාපොරොත්තු වෙන්න බෑ. අපේ ළමා පරපුර, නව යොවුන් සහ තරුණ පරපුර සබුද්ධික කිරීමේ වගකීම අපිට තියෙනවා.''

''අපේ රටේ සදාචාරසම්පන්න දේශපාලනයක් කියන්නෙ හීනයක් තමයි.''

''හීන හැබෑ කරගන්න නම් වැඩ කරන්න ඕන. **අඳුරට සාප නොකර ඡන්දදායකයාගේ හෘදය සාක්ෂිය දැල්වීම මේ මොහොතේ අපේ වගකීම. කතෝලික අපට ඒ වගකීම ඉටුකරන්න නිවැරදි මාර්ගෝපදේශයක් තියෙනවා. ඒ තමයි ජේසුස් වහන්සේ ඉගැන්වූ විමුක්තිදායක ප්‍රේමයේ දැක්ම. අද ජේසුස් වහන්සේ නම් කාට ඡන්දෙ දෙන්න කියයිද කියල තමන්ගෙම හෘදය සාක්ෂියෙන් අහල බලන්න. ජේසුස් වහන්සේ අපට ප්‍රේම කළ තරමින් දශමයක ප්‍රේමයක්වත්, කැපවීමක්වත් නැති දේශපාලකයකුට කතිරෙ ගහන්න සැබෑ කතෝලිකයකුට බෑ. ජේසුස් වහන්සේ ගිය මඟ ගන්න සැබෑ කිතුනුවකුට අනේ අපිට දේශපාලනයෙන් වැඩක් නෑ කියල ඇහැ කන පියාගෙන ඉන්නත් බෑ. එදා ආගමික නායකයොයි, දේශපාලන බලාධිකාරයයි එකතු වෙලා ජේසුස් වහන්සේගේ කර මත තැබූ කුරුසිය, අද අපේ කර මත බව අමතක නොකර මේ ගමන යමු.**''

**- තරංගනී රෙසිකා -**



# "මම අසමර්ථ වුවහොත් ඒ ගැන මම පසුතැවිලි නොවන බව දනිමි. එහෙත් මා පසුතැවිලි වියහැකි එකම දෙය වන්නේ උත්සාහ නොකිරීමයි"

## - ජෙෆ් බෙසෝස් (Jeff Bezos)

ගතවූ මාස කීපය ඉතාමත් නොසන්සුන් හා මානසික පීඩාකාරී තත්ත්වයක් උදාකර තිබූ බව නොරහසකි. කොවිඩ් - 19 පැතිරීමත් සමඟ ලෝකවැසි සියලු දෙනාටම තම නිවෙස් තුළ ඉතාමත් වගකීමකින් කටයුතු කරන ලෙස රාජ්‍ය සහ සෞඛ්‍ය බලධාරීන්ගෙන් ලැබුණු මානුෂ ඉල්ලීම්වලට සහයෝගය ලබා දෙමින් බොහෝ දෙනෙක් තම නිවෙස්වල දෛනික හා මතුකාලීන අවැසියාවන් පෙරදැරි කරගෙන තම කාර්යභාර සැලසුම් කරන්නට යෙදුණහ.

යමෙක් කාලෝචිත ලෙස තම ගෙවතු වගාව හා සත්ත්ව පාලනය ගැන යොමු වූ අතර පාසැල් ළමයින් රූපවාහිනිය, අන්තර්ජාලය වැනි දූරස්ථ අධ්‍යාපන මාධ්‍යය ඔස්සේ තම අධ්‍යාපන කටයුතු කාර්යක්ෂමව කරගෙන යෑමට පෙළගැසුණු බව දනිමු.

අපි මොනයම් තරාතිරමක සිටියත් නිවහල් ජීවිතයක් ගත කිරීමට ආශා කරමු. අපගේ මිනිස් සබඳතා නොසලකන සමාජ බැඳීම් බිඳ දමා කටයුතු කිරීම මෙයින් අදහස් නොකෙරේ. මම සැලසුම් කරන ගමන් මඟ, මගේ සහ මුළු සමාජයේ අභිවෘද්ධිය සඳහාත් මිනිස් බවේ උත්තරීතර ඉලක්ක ඉෂ්ට කරගන්නා ඒකායන අධිෂ්ඨානයෙන් හසුරුවා ගතයුතු බවත් අමතක නොකළයුතු වේ. ඔබ ජීවිතය ජයගන්නා අටියෙන් කරන්නට යොමුවන දෙය ගැන යම්විටක ඔබගේම නිවැසියන්, දෙමාපිය සහෘදයන්ගෙන් පවා බාධා ඇති වීමට අවකාශය තිබේ. **"ඔබ නව නිර්මාණයක් කරන්නට කැමැත්තේද, අනුන් විසින් වරදවා තේරුම් ගනු ලබන්නටත් කැමති විය යුතු"** බව ජෙෆ් බෙසෝස් පවසයි.

ජෙෆ් අප බොහෝදෙනකු අසා ඇති වර්තමාන ලෝකයේ පොහොසත් පුද්ගලයන් අතර පළමු ස්ථානයේ පසුවන්නා ලෙස සටහන් වේ. ඔහුගේ සාමාන්‍ය දිවි පෙවත සැකෙවින් බැලුවොත් ඔබ වැනි ඕනෑම දරුවකුට එවන් අත්දැකීමක් ලැබීම අසීරු නොවේ. එහෙත් ඔහු සටහන් කරන අයුරින් "යම් ව්‍යාපාරයක් හැමදා බැබලී සිටීමට ඇබ්බැහි නොවිය යුත්තේ, බැබලීම තාවකාලික හෙයිනි", යන්න අප මනසෙත් තරයේ සනිටුහන් කර තැබීම මැනවි.

ජෙෆ් බෙසෝස් උපත ලැබුවේ 1964 ජනවාරි 12 වන දින, නව මැක්සිකෝවේ ඇල්බුකුවෙක් නමැති ප්‍රදේශයේ යැයිද, තම සීයා ඇමරිකා එක්සත් ජනපදයේ පරමාණු ශක්ති කොමිෂන් සභාවේ පලාත් අධිකාරීවරයකු ලෙස කටයුතු කර නිසි කලට පෙර විශ්‍රාම ගිය බවත්, ඉන්පසු තම ගොවිපලේ දෛනික කටයුතුවල නිදහස්ව නිරතවූ බවත් සැලවේ. පාසැල් නිවාඩු කාලවලදී ජෙෆ්ද සීයා සමඟ ගොවිපලේ කටයුතු වල නිරත වූ බවද සඳහන් වේ.

බොහෝවිට ඔහුගේ විද්‍යාත්මක දෙයට ඇති ලැදියාවත්, තාක්ෂණික කුසලතා විදහාපාන අයුරින් කටයුතු කළ බවත්, වරක් තම සොයුරු සොයුරියන් තම කාමරයට ඇතුළු නොවන සේ විදුලි රැහැන් මඟින් අනතුරු සංඥාවක් සකස් කර තැබූ බවත් සඳහන් වේ.



ජෙෆ් තම අධ්‍යාපන කටයුතු මයැමි පල්මෙටෝ (Miami Palmetto) උසස් අධ්‍යාපන ආයතනයේ හැදෑරූ අතර ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය විද්‍යා පුහුණු කාර්ය සැලැස්මකට සම්බන්ධව කටයුතු කර ශ්‍රීමත් හෝ නයිට් නම්බුනාමය සහිත කුසලානක්ද ලබාගෙන ඇත. 1986 ප්‍රින්ස්ටන් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලැබූ ජෙෆ්. පරිගණක විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයෙක් ලෙස සේවා ආරම්භ කර, පසුව ෆීටෙල් (FITEL) සමාගම වෙනුවෙන් ජාත්‍යන්තර සේවා ජාලයක් නිෂ්පාදනය කිරීමට සමත් විය.

1994 වසරේදී ඇමසොන් ඩොට් කොම් (Amazon.com) නමින් අන්තර්ජාලය හරහා පරිශීලනය කළහැකි හා මිලදී ගතහැකි, පාවිච්චි කරන ලද පොත් ගබඩාවක් ආරම්භ කරන ලදී. ආරම්භයේදී කඩිනම් සාර්ථකත්වයක් නොතිබුණත්, කල් යාමේදී විශාල පොත් ලේඛනයක් ගොඩනැගුණු අතර ඇමසන් ඩොට් කොම් ජනතාව අතර ශීඝ්‍රයෙන් ප්‍රචලිත විය. 1998 දී ලෝකයේ ධනවත් 400 දෙනා අතරට එකතුවන්නටත් 2020 දී ලෝකයේ පළමු ධනවත් පුද්ගලයා බවට පත්වන්නටත් ජෙෆ් බෙසෝස්ට හැකි වී ඇත. ඔහුගේ ධනයේ අගය ඩොලර් බිලියන 117.8 ක්. (බිලියනයක් මිලියන 1000කි)

වර්තමාන අසීරු තත්ත්වය පදනම් කරගෙන උදාවන්නට ඇති අපහසුතා හමුවේ ජෙෆ් පවසන පරිදි, **“තදින් වසා ඇති පෙට්ටියකින් පිටවන්නට ඇති එකම මාර්ගය වන්නේ ඔබ ඔබගේ මග සොයා ගැනීමයි”** යන්න ඔබටත් අස්වැසිල්ලක් වේවි.

**ගරු මැක්සිමස් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා,**
ද මැසනඩ් නිවාසය,
මට්ටක්කුලිය.

# හෙළයේ මැණිකක් වන්න....

ගුරුවර දෙමාපිය ඔවදන් හිතට ගෙන
යුතුකම් අයුතුකම් හරිහැටි හැඳින දැන
නිහතමාන ගතිගුණ හදවතට ගෙන
මිනිහෙක් වෙයන් පුතුනේ නුඹ ඉදිරි දින

ඉසිකෝ මද මාන තණ්හා දුර ලන්න
කරුණා දයා මෙත් ගති හද පුර වන්න
අනුන්ට බරක් කිසි විටකදි නොම වන්න
ඔබ දිනූ හෙළය මත පුත මැණිකක් වන්න

ඉදිරියේ හෙළ රටේ දියුණුව ඔබේ අතයි
කම්මැලි නොවී කඩිසර කර සිතයි ගතයි
වැඩ කළහොතින් පුතුනේ ජය ඔබේ මතයි
පුතු හිනැහෙන්න ඒ ජය මුළු දැයට හිතයි

රට ජාතියට ඔබගෙන් එළියක් වේවා!
පියකුගේ හදින් නැගෙනා පැතුමන් මේවා!
දෙවිඳුන් ඔබේ දිවියට ආසිරි දේවා!
පුතුනේ ඔබේ දිනුම රටටත් හිත වේවා!

**- සී. ආර්. ඩික්සන් ඇන්ටනි -**
පේරලන්ද

## ආදරණීය දරුවනි,

“ළමා ප්‍රබෝධනය” ට
ඔබගේ ලස්සන නිර්මාණ
කවි, ගීත, නිසඳැස්, කෙටි කතා, ලිපි, සිතුවිලි
ආදී වශයෙන් ලබා ගැනීමට, අපි බොහොම
කැමැත්තෙන් සිටිමු. ඔබ එවන ඒ නිර්මාණය සමඟ
ඔබගේ භාරකරුගේ දුරකතන අංකය සහ ලිපිනය ද
අප වෙත එවන්න.
සංස්කාරක පියතුමා,
**“භක්ති ප්‍රබෝධනය”,**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**
E-mail: bhakthi.prabodhanaya@gmail.com

# කොරෝනාව සහ ලාංකේය ජන සමාජ විකාශනය

තවමත් ශ්‍රී ලාංකේය ජනසමාජය මිනිස්කමින් පොහොසත් බව පෙන්වූ ඉතා ශ්‍රේෂ්ඨ අවස්ථාවක් ලෙස පසුගිය හා අප මේ ඉන්නා කොරෝනා සමය හඳුන්වා දිය හැක.

පාලකයන්, සෞඛ්‍ය අංශ, ත්‍රිවිධ හමුදාව ඇතුළු වගකීම් දරන්නන් කොපමණ වෙහෙස මහන්සි වුවත් බහුතර මහජනතාව කැපකිරීම් නොකළා නම් කොරෝනා රෝගය පැතිරී ලංකාවට සිදුවිය හැකි විපත සීමාකර ගන්නට ඇති අවස්ථාව අහිමිවනු ඇත. ශ්‍රී ලංකාව එය මොනවට පෙන්වූයේ මෙම ප්‍රශ්න පත්‍රය ලොවටම පොදු එකක් බැවිනි. ඉතා දියුණු රටවල සිට ඉතා දිළිඳු රටවල් දක්වා එක ලෙස පැතිරී ගිය මේ මහා වසංගතය එක් එක් රටවල මානව දර්ශක පරීක්ෂා කිරීමට ආ මරණීය විභාගයක් වැනිය.

මෙහිලා ඒ මානව දයාව පෙන්වූ ගමේ ජීවත්වූ මැගීලාගේ හා සිරිපාලලාගේ සිට ජනපති මැඳුරේ රජුට පවා කීර්තිය ඉතාමත් නිර්ලෝභි ලෙස අප පිදිය යුතුය. ගමේ හොඳ කොස් ගසක් සහිතව ජීවත් වූවෝ ඉතාමත් ත්‍යාගශීලීව එය බෙදා ගත්හ. රතන සූත්‍ර දේශනාව හැම පන්සලකම ඉහළින්ම ස්පීකරය බැඳ හවස් ජාමයේ විකාශය විය.

කාදිනල් හිමිපාණන්ට අවනත වී පවුල් ජපමාලය නොනවත්වා අපේ නිවෙස් වල උච්චාරණය ඇරඹිණ. දේවමාතාවන් වහන්සේ මහා ව්‍යසනයකින් මේ කුඩා දිවයින ආරක්ෂා කළ සේක.

මහ දරුණු, අවිශ්වාසවන්ත වූ පුද්ගලයන් පවා වායු රික්තක වලදී (Air Pocket) ඉංග්‍රීසියෙන් ටිකක් බිය වී කියන "my god" වෙනුවට, තම පවුල සමඟ දණ නමා හැම වෙලේම දෙවියන් සිහිකරන තැනටම ගෙන ඒමටම කොරෝනා සමත් විය. ඉතා කාලකණ්නී ගමන් බිමන් බහුලව තිබූ තරුණ හිතුවක්කාරයන්ගේ ගමන් සීමා විය. රූපලාවන්‍යාගාර හිස්වී මිනිසුන් සැබෑ පෙනුමෙන් සිටියහ. හන්දියේ දොස්තර ගාව හෝ ඉතා ඉහළ තරු පන්තියේ ආරෝග්‍ය ශාලාවල චැනල්වල සිටි නෝනලා මහත්වරු සිද්ධාලේපය ගා සරල පෙති ගිල සැනසුණහ. එකා පරයමින් කසාද බැඳ වර්ෂ ගණන් ණය ගෙවන මහා සෝබන කසාද නැවතුණි.

මිනිසුන් වශයෙන් අප හැමටම මහා ධර්ම විවේකයක් ලැබිණි. පිට රටට දිව දික්කර ඉන්නා ජාතිය ස්වනිර්මාණ වලින් ස්වයංපෝෂිත වීමට පටන් ගෙන ඇත. පල්ලියේ පන්සලේ පැවිදි උතුමන්ගේ කීමට ගරු කරමින් කටයුතු කරන ස්වර්ණමය යුගයක් ඇරඹුණි. තාක්ෂණයට පින් සිදු වන්නට උදේ හවස පෞද්ගලික බස් රථ වලින් බැණුම් ඇසූ සාමාන්‍ය ජනතාවට දෙවිඳුන් විසින් අනර්ඝ නිවාඩුවක් සහ ගෙදර සිට වැඩ කිරීමට අවස්ථාව දෙන ලදී.

පැය ගණන් ගතවන ඇතැම් කාර්යන් ඉතා ඉක්මනින් කළ හැකි බව ප්‍රත්‍යක්ෂ විය. දෙමාපියන් විසින් සමහර වෙලාවට හැල්ලු කළ තම දූදරු අධ්‍යාපනය හා ගුරු භවතුන්ගේ වැඩ, අන්තර්ජාලය ඔස්සේ ගෙදරට පැමිණීම හා ඒවා කිරීම මුළු පවුලේම වගකීමක් විය. ඒවාට පිළිතුරු අම්මා තාත්තාද දෙති. මුනුබුරන් පාසල් රැගෙන යන ආච්චිට සහ සීයාට නිවාඩුවක් ලැබී ඇත. හන්දියේ කඩේ පිළිකා කාරක යහමින් දමා හදන කොත්තු රොටියට වඩා කුසේ හොවා වැඩූ මෑණියන් හා පියාණන් අත්හදා බලන ආහාර රස විඳීමටද අමාරුවෙන් වුවත් අප තරුණ පරපුර කොරෝනා කල හුරු විය. මහ ලොකු හෝටල්වල හා වන සතුන් අධික කැලෑවලත් කඳුවලත් අමාරුවෙන් ගොස්, "Feel excellent in hilltop" හෝ "feel happy with friends" යැයි මහ කෙරුම්කාරයන් අන්තර්ජාලය පසෙකලා වළං පිඟන් සෝදා පවුල සමඟ හැබෑම සමඟි සන්ධානය නිර්ලෝභව සහ අව්‍යාජව භුක්ති වින්දාහ. උගත්කම හා ණය දෙන තැන්වල පෝලිම් නොතිබුණා නොවුවත් මූල්‍ය හා ආහාර සුරක්ෂිතතාව ගැන ඉතා ඉහළ ප්‍රගතියක් ලාංකික සමාජය ලබා ගෙන ඇති අතර එය ශ්‍රී ලාංකික ආර්ථික ඔස්තාර්ලාගේ ආර්ථික

අධ්‍යාපනය හා ලෝක ආර්ථික කඩා වැටීම් ලෙස ඉතා හරබර නොවුවත් සමාජ ආර්ථික දියුණුවක් ලෙස අපට දැකිය හැකිය.

නාවික හමුදාවේ කොරෝනා ව්‍යාප්තිය හැරුණු කොට ශ්‍රී ලාංකික කොරෝනා මර්දනය වීම දකුණු ආසියාවේ පමණක් නොව ඉතා ඉහළ දර්ශක සහිත දියුණු රටවලටද මවිතයකි. ප්‍රංශයේ චාල්ස් ඩිගෝල් මහා නෞකාවේ 4000කට අධික නාවිකයන් අතරත් කොරෝනා පැතිරෙන බවට පවසා උදවු ඉල්ලූ හා කොරෝනා පැතිරී ගිය ඇමෙරිකානු යුද්ධ නාවික මහා නෞකාවක් කොරෝනාවලින් ඉතිරී යද්දී අප හමුදා කළ මෙහෙය අනුපමේය වේ.

ඉතා විශිෂ්ට සෞඛ්‍ය සේවයක් තවමත් අප සතුව ඇති බව පසක් කළ මේ පීඩන සමය මුඛ ආවරණ නැතැයි කියා සේවයට නොගිය ඇමෙරිකානු හෙදියන්ට වඩා උත්තරීතරය. ඉතා අවම පහසුකම්වලින් උපකරණ නිම කර ඒවා භාවිත කර, රෝගී සත්කාර කර, සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවයට වඩා මනුසත්කම මනාව පෙන්විණ.

විවෘත ආර්ථිකය හා බද්ධ වී එළියට ආ කුඩුකාරයන්ට ඉතා අවාසනාවන්ත කාලයක් උදා විය. මත් ලෝලයන් ගණන අප රටේ මෑතකදී ඉතාමත් ශීඝ්‍ර ලෙස ඉදිරියට ආ අතර ඔවුන් නිසා වූ ව්‍යසනය අප කතෝලිකයන් වෙසෙන ජාඇල සුදුවැල්ල අපට මොනවට පැහැදිලි විය. සමාජ ව්‍යසනයේ මරණීය තත්ත්වයකට එය ගෙන යන බව "සුදු වැල්ලේ කුඩ්ඩා" අප සමාජයට උදාහරණ සපයයි.

ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ කුඩු වසංගතය හා මත්ද්‍රව්‍යවලට විරුද්ධ බලවේග ගොඩ නැගීම අද කාලීන අවශ්‍යතාවකි. මා ජීවත් වන ග්‍රාමයේ කසිප්පු වෙළඳ මහතා ගංජා ද විකුණන අතර ඔහුව සොයාගැනීමට GPS තාක්ෂණය අවශ්‍ය නැත. මගේ වයස අවුරුදු 35 ඉක්මවූ අතර හැම වර්ෂයකදීම OIC මහත්වරුන් අප ගම් හතරටම එන යන අතර කසිප්පු වෙළෙන්දෝ තවම යෙහෙන් වැජඹෙති. ඔවුන් කිසිදා කොරෝනා කාලයේදී වූ ජංගම වෙළෙන්දෝ නොවෙති. ඔවුන් ඉතා ක්‍රමානුකූලව කසිප්පු විකුණන ඉතා පරිස්සමින් බැංකු ගිණුම් පවත්වාගෙන යන ප්‍රසිද්ධ පුද්ගලයෝ වෙති. මා පෞද්ගලිකවම 2 ශ්‍රේණියේ සිට අඛණ්ඩව කොළඹටත්, පෑලියගොඩටත් අප ගමේ කසිප්පු මාමා ගැන තොරතුරු කීවත්, අදටත් තත්ත්වය ශෝචනීය වේ.

අදටත් කසිප්පු මාමාගේ කුඩු ගංජා අප නිවස අසල ඉතා ජයට විකිණෙන බව ගම්මුන් සියලු දෙනා දන්නා මුත් ඒවා නතර කිරීමට කොරෝනාවට බැරි විය. මම සමහර විට වෛද්‍ය අධ්‍යාපනයේදී ගංජා බිව්වාම පිස්සෙක් වනවාය යන්න ඉගෙන ගෙන ඇති නමුත් ගමේ කසිප්පු හල් හා කුඩු විකුණන ගැහැණු පිරිමි අල්ලා ගැනීමට නොහැකි වුවද කොරෝනා පැරදවිය හැකි රාජ්‍ය සේවයක් ඇති නිසා හිත හදා ගනිමි. කසිප්පු මුදලාලිගේ පුත්‍රයා මගේ ඉතා හොඳ මිතුරෙකි. ඔහු අරක්කු නොබොයි. ගමේ විසීම සුදුසු නැතැයි කියා අවනම්බුයි කියා ඔහු පොළොන්නරුවේ පදිංචි වුවත්, තාත්තාගේ වෙළඳාමෙන් ලැබෙන මුදල් කොටසක් ඔහුට යවන්නේ ඉතා ඉහළ සමාගම් වල ලාභාංශ කොටස් කරුවන්ට යවන පරිද්දෙනි. මා විශ්වාස කරන පරිදි දාන ශීල, භාවනා ඉතා ඉහළින් අගය කරන ව්‍යසනකාරී තත්ත්වයේදී අපට නායකත්වය දුන් සාර්ථක පාලකයනට කුඩු හා මත් උවදුර පාලනය කර හැකි නම් එය ඉතා ඉහළ ක්‍රියාවකි. ප්‍රශ්නාර්ථයකට ඇත්තේ ඉතා හොඳ ජනතාවක් "බාර්" හිමියන්ට කතිරය ගසා පාර්ලිමේන්තුවට යවන්නේ ඇයි දැයි වේ.

ජනතාවගේ කතිරය උගත්කමටවත්, පරපුරටවත් නොදී මනුෂ්‍ය කමට පමණක් දුන් කලට යහපත උදා වනු ඇත. හේතුව වන්නේ පත්තරේ ඇති කරුණු අනුව ගුද මාර්ගයේ අයථා ලෙස දුරකථන බන්ධනාගාරයට යන අතර වෛද්‍ය විද්‍යාව කළ මා බන්ධනාගාරය තුළ පෞද්ගලිකව දුරකථන ගෙන යාමේදී ඇති වන දුෂ්කරතා කොපමණ යන්න ප්‍රශ්නාර්ථයකි.

ඒ නිසා උගත්කමින්වත්, වත්පොහොසත්කමින්වත්, පරපුරවූ පරිදිත් සමාජයට නායකයන් නූපදින අතර එය ගුණයෙන් පමණක්ම උපදින බව කොරෝනාව ඉදිරි ඡන්දයට පෙර අපට පෙර වදන ලියා ඇත. තවද, තවමත් ක්‍රියාත්මක බහු ජාතික ඖෂධ ජාවාරම්කරුවන් හා ඔවුන්ට උඩ ගෙඩි දෙන ඉතා උගත් පුද්ගලයන් සිටිනා රටක අභිරහස් මරණයක් මහාචාර්ය සේනක බිබිලේට ගෙන දුන් අතර, නැගෙනහිර පළාතේ උක් වගා ආශ්‍රිත දැඩි රසායනික පොහොර (glyposate - පොහොර) හා බැඳුණ ලෙඩ රෝග හා සමහර විපරීත හා විසඳුම් කථා කළ අදටත් අභිරහස් ඝාතනයක් වූ අප සාන්තුවර මයිකල් රුදිගු නි.ම.නි. පියතුමා රෝමයේදී සාන්තුවර ප්‍රකාශ නැතත්, ජනතාව අතර එතුමා සාන්තුවරයෙකි. තවද ඇමරිකානු කළු ජාතික ජෝර්ජ් ෆ්ලොයිඩ් වෙනුවෙන් කෑ මොර දෙන ශ්‍රී ලාංකීක ජනතාවට මා පැනයක් තබමි. එනම් පාස්කු ප්‍රහාරයේ නීතිය උගත් ඒවා පරික්ෂා නොකරපු අය, ප්‍රහාරය දැනුවත් වී ලිඛිතව ලබා දී, ඔවුන් නිවාඩු දමා නිවාඩු නිකේතනවල සැපට සිටිද්දී, මේ සියල්ල දත් ඉහළ පෙලේ නායකයන් තවමත් රැළි අමතද්දී ශ්‍රී ලාංකික ඔබේ කොඳු ඇට පෙළ අතගා බැලීම වටී.

තවද සමහර නීති රකින ප්‍රධානයන් අප මීසම් සේවක පියතුමා දන්වා ඇති බව පරසක්වළ ගසා කියන අතර පියතුමා මට එසේ කීවේ නැත කියා කියද්දී මට මතක නැතැයි කියන දිව දෙකේ ඔවුන් අපව ආරක්ෂා කරනවා යන්න දැන් අපට විහිළුවකි. ඇමෙරිකානු ජෝර්ජ් මෙන්ම කිසිදු වරදක් නොවූ දෙවිඳුන් යදිද්දී දැන දැන අප ජනතාව මරා දැමීමට වග කිව යුතු සියලු දෙනාට යුක්තිය අප තදින් ඉල්ලා සිටිය යුතු අතර කුඩු හා අනෙකුත් මත් ද්‍රව්‍යවලට විරුද්ධව ඉතා තදින් පෙළ ගැසීමට කාලය එළඹ ඇත. තවත් අප සමාජයේ යුක්තිය උදෙසා වූ හඬ බිහිරිය, ගොළුය. යුක්තිය ලැබෙන්නේ පිනට නොව ඒ උදෙසා වූ අප සාපිපාස වූ සැටියට බව අප මහා යුක්තිධර ක්‍රිස්තුස් වහන්සේ කන්ද උඩ දේශනාවේදී අපට කියා දී ඇත.

එක්තරා වකවානුවක අප රටේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ත්‍රස්ත වාදය ඉතා ඉහළින් තිබූ යුගයක ගම් දනවු පිටින් ටයර්වල පිලිස්සුණු යුගයක ඉෂ්ට නොවූ බටලන්දේ යුක්තිය අප කෙසේ සාක්ෂාත් කරම්ද? ඩොලර් 35,000 ක් නොමැතිව ඇමෙරිකානු ඉහළ පෙලේ රෝහලක මිය ඇදුණ සෞඛ්‍ය රක්ෂණ නොමැති කොරෝනා රෝගියා අපට පවසන්නේ රාජ්‍ය සෞඛ්‍ය සේවයේ හා නිදහස් සෞඛ්‍ය පද්ධතියේ තිබූ දැඩි අවශ්‍යතාවයි. ගමේ සිරිපාලලාට හා මැගී අක්කලාට පෞද්ගලික රක්ෂණාවරණ එනතුරු ඒ අවශ්‍යතාව හා එහි වටිනාකම මේ කොරෝනා සමයේ අපට මනාව පැහැදිලි විය.

බහු ජාතික සමාගම්වල ඉතා බාලම ආකාරයේ මාදිලියක් වන ලීසිං ත්‍රස්තවාදය අප මෑතකදී අත්දුටු යථාර්ථයක් වන අතර දැනට නොපවතින යටත් විජිත ක්‍රමය වෙනුවට නව වෙළඳ ආක්‍රමණ වලට අප දැනටමත් හසු වෙමින් ඇත.

කොරෝනා සමයේ ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමයට මරු පහරක් වන්නේ මේ බහු ජාතික බූවල්ලාගේ අප නොදකින හිත මිතුරු ස්වරූපයෙන් වන විනාශයක් දැනටමත් අප අතර ඇත. අප රටක් ලෙස අප ඖෂධ අප රට තුළම නිපදවා ගැනීම අවශ්‍ය අතර මෙතෙක් ඒවා කර නොගත හැකි වුයේ බහු ජාතික ඖෂධ ජාවාරම්කරුවන් ඉහළ සිට පහළට අදාල පුද්ගලයන් නඩත්තු කළ නිසා නොවේද?

සීනි, කඩදාසි නිෂ්පාදනාගාර වැරදීමකින් විකුණූ ඇමතිවරු අදටත් කතිර බලාපොරොත්තුවෙන් සිනාසෙන අතර ඉහළ තලවල ඉන්න ආර්ථික ඝාතකයන්ගෙන් රට බේරා ගතයුතුව ඇත්තේ ඔබ අපය. පිටරට සිට විප්ලවකරුවකු මෙරටට නොපැමිණෙන අතර ඒ අප කවුරුන් හෝ වේ.

**වෛද්‍ය සචිත මෙන්ඩිස්**

වෛද්‍ය නිලධාරී,
ප්ලාස්ටික් ශල්‍ය ඒකකය,
උතුරු කොළඹ - රාගම.

# අපෙන් සමුගත් ගරු හිලරි පීරිස් නි.ම.නි. පියතුමා



මොරටුව කඩලාන ග්‍රාමයේ එම්. මාර්සලස් පීරිස් සහ ඩබ්. මේරි ඇග්නස් යුවලට දාව 1952 වසරේදී හිලරි පීරිස් දරුවා උපන්නේය. මොරටුව සා. සෙබස්තියන් හා කොළඹ කොටහේන සා. බෙනඩික් යන විදුහල්වලින් අධ්‍යාපනය ලැබූ සිසුවා, පූජක පුතකු වීමේ අපේක්ෂාවෙන් 1968 පෙබරවාරි මස කොහුවල සා. ජෝසප් නි.ම.නි. කනිටු දෙව්සත්හලට ඇතුළත් විය. 1977 වසරේදී, නිර්මල මරිය නිකාය තුළ පැවිදි ජීවිතය ආරම්භ කර සහෝදරතුමකු ලෙස වැඩිදුරටත් දේව ධර්මය හැදෑරූ මෙතුමා, 1980 අගෝස්තු මස 23 වන දින පූජකවරම් ලැබීය.

කොළඹ අගරදගුරු පදවියේ රෝහල් උපාධ්‍ය සේවාවට එක්ව සිය පූජක දිවිය ඇරඹූ මෙතුමෝ, වෙන්නප්පුව 'නාසරෙත්' හි පූජක සංඝයේ දේශනාවාදී පියතුමකු ලෙසද ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල කතෝලික සඟරාවේ සංස්කාරක පියතුමන් (1985 - 1988) ලෙසද පත්වීම් ලදහ. පසුව අනුරාධපුරය 'රජබිම 'නිර්මල මරිය නිකායික සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පියතුමා හැටියටත්, මිනුවන්ගොඩ පොල්වත්ත "දෙව්අරණ" නි.ම.නි. මධ්‍යස්ථානයේ දේශනාවාදී පැවිදි පොදු හවුලේ ප්‍රධාන පියතුමා ලෙසත්, කොළඹ මරිය නිකායික ප්‍රාදේශිකයේ උපදේශක මණ්ඩලයේ සාමාජික පියතුමකු ලෙසත් සේවය කළේය. පසුව මරදාන පාතිමා අප ස්වාමිදුවගේ දෙව්මැදුරේ මීසම් සේවක පියතුමන් ලෙස වැඩ භාර ගත් මෙතුමා ඉන්පසුව මරිය නිකායේ ප්‍රාදේශාධිපති පියතුමන්ගේ ලේකම් පියතුමා හැටියටත්, ඉන් පසුව කොළඹ සිර කඳවුරු උපාධ්‍ය පියතුමා ලෙසත්, අනතුරුව වෙන්නප්පුව 'නාසරෙත්' දේශනාවාදී පූජක සංඝයේ සාමාජිකයකු ලෙස, වෙන්නප්පුව ශුද්ධ වූ පවුලේ පැවිදි සොහොයුරියන්ගේ උපාධ්‍ය පියතුමා වශයෙනුත්, අවසාන වශයෙන් මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයෙත් සේවය කෙළේය. මෙතුමාගේ පූජක දිවිය වසර 40ක් පුරා දිව යන්නකි.

දක්ෂ ලේඛකයකු සහ ප්‍රකට දේශනාවාදී පියතුමකු ලෙස තමන්ටම අවේණික වූ උපහාසය මුසු දේශනා රටාවකින් හෙබි මෙතුමා 2005 වසරේදී තමන් කළ දේශනා ඇතුළත් කොට "මේක යකාගේ කතාවක් නේ" නම් වූ ග්‍රන්ථයක්ද නිකුත් කෙළේය.

මානුෂ ගුණාංගවලින් පිරි සරල දිවි පෙවෙතකට ආශා කළ ගරු හිලරි පීරිස් නි.ම.නි. පියතුමා නිතරම සිනා මුසු මුහුණින් තම පූජක දිවිය ගත කළ නිහතමානී පූජකතුමෙකි.

කොරෝනා වසංගත තත්ත්වය තුළ දෙව්මැදුරු වසා තිබූ හෙයින් මෙතුමාගේ අවමංගල්‍ය කටයුතු ඉතාමත් චාම් ලෙස පවුලේ අය ඇතුළු ගරු පියතුමන්ලා සහ සහෝදරතුමන්ලා සීමිත පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක පියතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය සහ ලේඛක පාඨක හැම සමඟ ගරු හිලරි පීරිස් පියතුමාට අපි සග සුව පතමු!

"හමුවේ දිනක ඒ ලස්සණ ලොවෙහි අප"

**- ටී. සුනිල් ප්‍රනාන්දු**

# කොරෝනාව, ඉතාලිය සහ මනුස්සකම

"වියා අවුරේලියා" පාර නැවතත් සක්‍රිය වෙලා. ගේට්ටුවෙන් පිටතට විත් කූඩුවෙන් නිදහස ලැබුණු කුරුල්ලකු වගේ මම ඇවිද ගියේ බොහෝ සතුටින්. පුරුදු වටපිටම නුපුරුදු ලීලාවෙන් නිරීක්ෂණය කරමින් කෙමෙන් කෙමෙන් වතිකානුව දෙසට මා ගමන් කළා. මාස තුනකට පසු දුටු තේජවන්ත ශාන්ත පීතර බැසිලිකාවේ දසුන, මසිතට කොයි තරම් සංවේදී කාරණයක් වුණා දැයි වචනයෙන් විස්තර කිරීමට නම් අපහසු වේවි.

වෙනදාට අතුරු සිදුරු නැතිව පිරෙන ශාන්ත පීතර චතුරශ්‍රය තවමත් පාළුවට ගොස්. පේදුරුතුමන්ව මරා දැමූ මේ පුද බිම මත ෆ්‍රැන්සිස් පාප්වහන්සේ, එදා මුළු ලෝකය කොවිඩ් වසංගතයෙන් මුදවා ගන්නැයි ඉල්ලමින් දිව්‍ය සත්ප්‍රසාදය ඉදිරියේ දණගසා යාච්ඤා කළ අයුරු මතකයට නැගේ.

මහ කණු අතර තිබෙන පඩිපෙළ මත වාඩි වී, පසුගිය මාස කිහිපය පුරා අප අත්විඳි ඒ කටුක අත්දැකීම මා නැවත මෙනෙහි කරන්නට පටන් ගත්තා.

චීනයෙන් පසු, ඉතා දැඩි ලෙස කොරෝනා වයිරසයට ගොදුරු වූ රටක් වූයේ ඉතාලියයි. 2020 ජුනි වන විට ආසාදිතයන් 233,000 කට අධික ප්‍රමාණයක්ද මරණ 33,000 ක්ද මෙරටින් වාර්තා වී තිබුණා. සියයට අසූවක් පමණ කිතුනු ජනගහනයක් වෙසෙන ඉතාලිය මෙවන් ඉරණමකට ගොදුරු වුණි නම්, දෙවියන් කියා කෙනෙක් සිටීද වැනි පදනම් විරහිත තර්ක ඉදිරිපත් කරමින් බොර දියේ මාළු බෑමට වෙර දැරූ අදේවවාදීන් මෙන්ම, එය "දේව සාපයක්" ලෙස හුවා දැක්වීමට උත්සාහ කළවුන් පවා දක්නට ලැබීමෙන් මා සිටියේ බොහෝ සේ කම්පාවෙන්. නමුත් කොරෝනා වයිරසය හරහා ඇසුණු දෙවියන් වහන්සේගේ හඬට වුවමනාවෙන් සවන් දුන් බොහෝ පිරිසක්ද ඒ අතර සිටියා.

ඒ කෙසේ වුවත්, මේ සියලු තර්කප්‍රතිතර්කවලට එහා ගොස්, මේ ව්‍යසනය හේතුකොට ගෙන මනුෂ්‍යත්වය කිරුළු පැළඳි අවස්ථා බොහොමයක් මේ සුන්දර මිනිසුන් වෙසෙන සුන්දර රටින් පසුගිය කාලය පුරා අසන්නට දකින්නට ලැබුණා.

**රෝහලේ ආදරේ**

මාර්තු මාසය උදාවත් සමඟම නොසිතූ අයුරින් උතුරු ඉතාලියේ රෝහල් බොහොමයක් කොරෝනා වයිරසය වැළඳුණු රෝගීන්ගෙන් පිරී යන්නට වුයේ රටවැසි සියලු දෙනා තිගැස්සීමට පත්කරමින්. නමුත් ඔවුන්ගේ සිත් සනසවා ගැනීමට උපකාරී වූ එක් කරුණක් වුයේ රෝහල් කාර්ය මණ්ඩලවල අති විශිෂ්ට කැපවීම ගැන පළවූ මාධ්‍ය වාර්තා. දිවා රෑ නොබලා, තමන් හෝ තම පවුල් ගැනවත් නොසිතා, එකදිගට වැඩමුර දෙකක් පවා කරමින් ඔවුන් දැක්වූ මිනිස්කමේ පොහොසත්කම සියල්ලන් ගේ පැසසුමට ලක්වූ බව නම් නොරහසක්.

තමන් හට පැවරී තිබුණු නිශ්චිත වගකීම්වලින්ද එහාට ගොස් නිර්මාණාත්මක අදහස් ඔස්සේ ඔවුන් නිතරම උත්සාහ කළේ රෝගීන් වෙනුවෙන් කළ හැකි උපරිම සේවය ඉටු කිරීමටයි.

එක්තරා රෝහලක හෙදියක් හැමදා උදෑසන කුඩා ශබ්ද විකාශන යන්ත්‍රයක් ආධාරයෙන් කොවිඩ්-19 රෝගීන්ව ආදරයෙන් ඇමතූ වීඩියෝවක් සමාජ මාධ්‍යවල එකල බොහෝ සේ ජනප්‍රිය වුවා. "සුබ උදෑසනක්. අපි හොඳාකාරවම දන්නවා මේ ඔබ ගත කරමින් ඉන්නේ ඉතාමත් අමාරු මොහොතක් කියා. නමුත් මේ වෙලාවේ ඔබේ පවුල්වල අයත් ඔබ ළඟින්ම ඉන්නවා. ඇත්තෙන්ම කිව්වොත් මුළු ඉතාලියම සිටින්නේ ඔබ ගැන හිතමින්." මෙසේ කියමින් ඉතාලි ජාතික ගීය ඇය තම ජංගම දුරකථනය මාර්ගයෙන් අසන්නට සැලසුවේ තමන්ගේ අනිකුත් සගයන් සමඟ ගායනයට ද එක් වෙමින්.

තවත් රෝහලක සේවකයන් එක්වී, යම් ප්‍රමාණයකට සුවය ලබමින් සිටි රෝගීන් ඉදිරියේ ආරක්ෂක ඇඳුමින් සැරසී සිටිමින්ම නර්තනයක

යෙදී, රෝගී සිත්වලට සහනයක් සැලසූවේ අව්‍යාජ සිනහවකින් මුව සරසාගෙනයි.

ක්‍රිමොනා යනු කොවිඩ්-19 දැඩි ලෙස බලපෑම් එල්ල කළ එක් නගරයක්. ක්‍රිමොනා ප්‍රධාන රෝහලේ ඉඩ පහසුකම් පවා මදිවීම නිසා තාවකාලික වාට්ටු ඉදිකිරීමක් පවා සිදු වුණා. නමුත් රෝහලේ කාර්ය මණ්ඩලය මැසිවිලි නොදොඩා කළ අමිල සේවය නගරයේ වැසියන් ට ආරංචි වීමට වැඩි කාලයක් ගත වුයේ නැහැ. රෝහල වෙත තෑගිබෝග ගලා එන්නට වුයේ ඒ අතරතුරදීයි.

"අපි වැඩට එන හැම දවසකම අපට යම්කිසි අලුත් දෙයක් ලැබුණා. පිට්සා, රසකැවිලි, කේක්, බීමවර්ග (Drinks) තවත් දවසක කෝපි පැකට් දහස් ගණනක් (Espresso), ඒවගේම, සුබ පැතුම් පත් එවමින් අපේ චිත්ත ධෛර්යය ශක්තිමත් කළා." හෙදියක් තම ප්‍රණාමය ජනතාවට පුද කළේ එලෙසින්.

ඉතාලියේ රෝහල්වල බොහෝ විට මරණාසන්න රෝගීන්ගේ පවුලේ සාමාජිකයන්ට හා සමීප මිත්‍රයන්ට තම ප්‍රියයන්ගේ අවසන් මොහොතේ ඔහු හෝ ඇය අසලට වී සිටීමට අවසර ලැබෙනවා. එහෙත් වයිරසය බෝවීම වැලක්වීම සඳහා එවැන්නකට තිබුණු අවසරය ඉවත් කළා. අඩුතරමින් රෝගියාගේ ළඟම ඥාතියාට පවා රෝහලට ඒමට නොහැකි වුණා. මෙවන් තත්ත්වයක් තුළ ඇතැම් හෙදහෙදියන් ඔවුන්ගේ දුරකථන වලින් මරණාසන්න රෝගීන්ගේ ඥාතීන්ව සම්බන්ධ කරගෙන ඔවුන් හා කතාබස් කිරීමට අවස්ථා උදා කර දීමට තරම් කාරුණික වූ අවස්ථා බොහොමයි. එක්තරා හෙදියක් රූපවාහිනී නාලිකාවකට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් පැවසුවේ, **"මිනිසකු අසරණව හුදෙකලාව මියයාම අප්‍රසන්න දෙයක් - එවැන්නක් කිසිවකුට සිදු වෙන්න එපා.** එකක් නොව ජංගම දුරකථන කිහිපයක්ම මගේ සන්තකේ තිබුණා නම් හොඳයි කියලා මට හිතෙන්නේ මේ වගේ වෙලාවකයි. එහෙම වුණා නම් මට තවත් බොහෝ රෝගීන්ගේ සිත් අවසන් මොහොතේ සුවපත් කරවන්නට තිබුණා".

රෝහල් වල සේවය කරන්නවුන්, තමන්ට වයිරසය වැළඳී ඇත්දැයි නිතර නිතරම පරීක්ෂණය කිරීම අනිවාර්ය අංගයක්ව තිබුණා. තම නීරෝග බව

සායන පරීක්ෂණ ප්‍රතිඵලවලින් තහවුරු වූ විට බොහෝ වෛද්‍යවරුන් හෙදහෙදියන් සතුටු වූයේ තමන්ට කොරෝනා ආසාදනය වී නොමැති බව දැනගැනීම නිසාම නොවෙයි. **තවදුරටත් අසරණ රෝගීන් වෙනුවෙන් සේවයේ යෙදීමට තමන්ට හැකියාව ඇති බව දැනගැනීමේ නිසා ඔවුන් ප්‍රීති වුණා.**

"සමහර වෙලාවට අපෙන් ඇතැමෙක් දුර්වල වෙනවා. බලාපොරොත්තු සුන් වූ හැඟීමක් අපට දැනෙනවා. ඒ මොකද කිවහොත්, අපි බලාගන්න රෝගීන් සුව අතට හැරෙන්නේ නැතිකොට අපි අසරණයි කියලා හිතෙනවා." ඒ තවත් වෛද්‍යතුමකුගේ වචන. එවැනි තත්ත්වයක් උද්ගතවූ අවස්ථාවල කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් වහාම ඉදිරිපත්වී බලාපොරොත්තු බිඳ වැටුණු තැනැත්තා හෝ තැනැත්තිය අස්වසාලීමට ඉදිරිපත් වූ ඡායාරූප සමාජ මාධ්‍ය වලින් ප්‍රචාරය වූවා.

ජුසේප්පේ බෙරදෙල්ලි, උතුරු ඉතාලියේ බෙර්ගමෝ නගරයට සමීප කස්නිගෝ ග්‍රාමයේ සේවය කරමින් සිට කොරෝනා වයිරසය හේතුවෙන් මිය ගිය 72 වියැති ගරු පියතුමෙක්. රෝහලේදී වෛද්‍යවරුන් විසින් එතුමන්ට පළඳවන්නට උත්සාහ කළ ආශ්වාසකය (Respirator) ප්‍රතික්ෂේප කර එය වෙනත් රෝගියකු වෙනුවෙන් යොදා ගන්නා ලෙස ඉල්ලීම් කළ පුවත ඔබටත් අසන්නට ලැබෙන්නට ඇති. (කෙසේ වුවත් ඇතැම් මාධ්‍ය, මෙහි සත්‍යභාවය විකෘත කර පුවත් මැවූ බවත් සඳහන්.) **කස්නිගෝ හි වැසියෝ එතුමන්ගේ දේහය භූමදානය සඳහා රැගෙන ගිය අවස්ථාවේ දී ඔවුන් ජීවත් වූ මහල් නිවාස වල සඳලුතලවල සිට එතුමන්ට ගෞරවාචාර කළේ ඉතාමත් සංවේදීවයි.**

**සමාජ දූරස්ථභාවය අපව තවත් ළං කළාද?**

නිවෙසින් පිට වීම සීමා කර තිබුණත්, හැකි පමණින් අනුන්ට සහාය වීමට ඉදිරිපත් වූ සිද්ධි

රසක් ඉතාලිය පුරා වාර්තා වුණා. දෙමව්පියන් දෙදෙනාම රෝහල්වලට අනුයුක්ත සේවයක යෙදී සිටි පවුල් මුහුණ දුන් ප්‍රධානතම ගැටලුවක් වූයේ

රාජකාරී වේලාවල තම කුඩා දරුවන් බලාකියා ගැනීමයි. මේ ප්‍රායෝගික ගැටලුව නිරීක්ෂණය කළ එක්තරා තරුණියක්, එවන් දරුවන් බලා ගැනීමට (babysitting) ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන්නන් සහ ඔවුන්ගේ දෙමාපියන් අතර "ඩිජිටල් පාලමක්" තැනුවා. දැන් ඇය නිර්මාණය කළ වෙබ් අඩවියේ දී ඔවුනොවුන් හමුවී, තමන්ට අවශ්‍ය දිනවලට

"ආයා කෙනකු" වෙන්කර ගන්නවා.

කොරෝනා වයිරසයෙන් පීඩා විඳි මුල් මාසය තුළ හැම දිනකම පාහේ සවස හයට, රටේ සිව්කොන වැසියෝ තම නිවෙස්වලින් පිටතට පැමිණ (දුරස්ථභාවය රකිමින්ම) එක්ව ගීත-ගීතිකා ගායනා කිරීම හෝ වාදනය කිරීම දක්නට ලැබුණු සුලභ දසුනක්. **එකිනෙකාගේ සිත්වලට ශක්තියක් ගෙනදීම එහි අරමුණ වුණා.** නමුත් දින සති ගෙවීයත්ම, දිනකට රෝගීන් සිය ගණනින් මියගිය බෙර්ගමෝ නගරවැසියන්ට එවන් දෙයකට සම්බන්ධ වීමට තරම් මානසිකත්වයක් තිබුණේ නැහැ. ඔවුන්ගේ වේදනාව හා සංවේදී වූ ජනයා කෙමෙන් කෙමෙන් ගීත ගායනය නවතා දැමුවේ ඔවුනට කරන ගෞරවයක් වශයෙන්. **යමක ආරම්භයත් අවසානයත් යන දෙකම සිදුවන්නේ, තමන්ට වඩා අනුන්ගේ යහපත පිණිස වීම කොයි තරම් නම් අපූරු කාරණයක්ද?**

එලෙසම, හිතින් හඬා වැටෙන තම සොයුරු සොයුරියන්ව නැගිටුවාලීමට බොහෝ පිරිස් තමන්ගේ හැකියා සමාජ මාධ්‍යවලට මුදා හැරියා. ගායන, වාදන, නර්තන මෙන්ම විනෝදජනක කතන්දර කීමද ඒ අතර වුණා.

මෙරට සංස්කෘතිය සැදී තිබෙන ආකාරය අනුව, බොහෝ වැඩිහිටියන් නිවෙස්වල තනිව ජීවත් වනවා. නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් ඔවුන් බොහෝදෙනකු ඉතා අසරණ අඩියකට වැටුණා යැයි කීම අතිශයෝක්තියක් නම් නොවෙයි. මේ තත්ත්වය මත සමහරු තම අසල්වැසි නිවෙස්වල සිටින එවන් වැඩිහිටියන්ට සහාය වන්නට නොපැකිලව ඉදිරිපත් වුණා. ඔවුනට අවශ්‍ය බෙහෙත්, බඩුබාහිරාදිය මිලදීගෙන ඒම ඒ අතරින් ප්‍රධාන වුවක්.

**එක මවකගේ දරුවෝ**

මේ අතීතාවර්ජනයෙන් මම බැහැර වුණේ, මිතුරු පියතුමෙක් චතුරශ්‍රයේ එහා පැත්තේ කුලුන අතරින් මා අසලට එමින් සිටිනු දැකීමෙන් පසුවයි. මුඛ ආවරණ පැළඳීම මිතුරන් හඳුනා ගැනීමට බාධාවක් නොවන්නේ නම් කොයි තරම් දෙයක්ද?

බෙර්නීනී නම් ඒ විශිෂ්ට කලාකරුවා, ශාන්ත පීතර චතුරශ්‍රය වටා ඉදිකළ මේ මහා කුලුනු ඔහු සාදා ඇත්තේ බැසිලිකාවේ දෙපස සිට ඉදිරියට එන සේ අර්ධ කවාකාර හැඩයකටයි. දිනක් පියතුමෙක් මට එහි යටි අරුත පැහැදිලි කර දුන්නා. "බෙර්නීනී මේ කුලුනු හැදුවේ, උඩ ඉඳන් බලපුවාම මනුස්ස අත්දෙකක් තව කෙනකුව වැළඳගන්නවා වගේ ආකාරෙන්. කළු-සුදු, දුප්පත්-පොහොසත් හැම කෙනාම මේ චතුරශ්‍රයේ එකට එකතු වෙනවා. **ශුද්ධවූ සභා අම්මා ඒ හැමෝවම වෙනසක් නැතිව ආදරයෙන් වැළඳ ගන්නවා.** සභාවේ විශ්වීයත්වය තමයි බෙර්නීනීට කියන්න ඕනෑ කළේ".


මගේ පුංචි රටේ ඇතැමුන් කොරෝනාව පවා ජාතිවාදීව, ආගම්වාදීව විග්‍රහ කරමින් සිටියා නොවේද? "අපි තමයි ලෝකේ හොඳම රට" වැනි ව්‍යාජ දේශ ප්‍රේමයක් මේ හරහා ව්‍යාප්ත කළා නොවේද? නමුත් දේශ සීමා, ජාති ආගම්, කුල මල බෙදීම් රේඛා යනු මිථ්‍යාව මේ වසංගතය අපට නැවතත් මතක් කර දුන් බව අපි කොහොම අමතක කරන්නද? ඒ අතර, ලෝකයක් ලෙස එක්ව සියලු අභියෝග ජය ගන්නට නම් **"අසල්වැසියාට ප්‍රේම කිරීම"** කළ යුතුම බව මට නැවත පසක් කර දුන්නේ ඉතාලිය යි.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන**

**(නි.ම.නි.) පියතුමා,**

රෝමයේ සිට.

# ගරු පෝරුතොට පියතුමා හා භක්ති ප්‍රබෝධනය සබැඳියාව



මේ සමයෙහි භක්ති ප්‍රබෝධනය සඟරාවට ලිපි ලැබීමේ අඩුවක් හේතුකොටගෙන එය ඉදිරියට ගෙනයාමේ අභියෝගය පැන නැගී තිබුණි.

සාමාන්‍ය ලෙස ලිපි සපයන අතරතුර "කාන්තා තීරයක්" අරඹා පොර්ලෙන්තිනා යන ආරූඪ නාමයෙන් ඒ ඌනතාව සපුරා ලන්නට පෝරුතොට පියතුමා පියවර තබා, ඒ කාලයේදී සඟරාව ශක්තිමත් කර සුරක්ෂිත කරන්නට වෙහෙස වූ වග ඉතිහාසගතය. එමෙන්ම වර්ෂ 1970 සිට ටී. ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා භක්ති ප්‍රබෝධනය සංස්කාරක වශයෙන් කටයුතු කරන විට ගරු පෝරුතොට පියතුමා සංස්කාරක පියතුමාට ඍජුවම සහාය දක්වමින් යුග මෙහෙවර පොහොනි කරන්නට උර දුන් අයුරු ගෞරවයෙන් ස්තුති පූර්වකව සිහිපත් කරමු.

දෙව්පියාණන් දුන් තලෙන්තු ඉතා හොඳින් අවබෝධ කරගෙන ආගමික දේව සේවයට අමතරව ලේඛන කලාවට ගරු අර්නස්ට් පෝරුතොට පියතුමා තුළ වූ අභිරුචිය ඉමහත්ය. දෙව්සත්හල් සිසුවකුව සිටිනා කාලයේ සිටම නිර්මල මරිය නිකායේ ප්‍රකාශනයක් වන භක්ති ප්‍රබෝධනයට ලිපි සැපයීමට එතුමා අමතක නොකළේය. ඒ 1950 වසරේ කොළොම්පුර සාන්ත ඇලෝසියසුන්ගේ දෙව්සත්හලේ, දෙව්සත්හල් සිසුවකුව සිටියදීය.

විශ්‍රාම සුවයෙන් සිටින කාලයේදී ද භක්ති ප්‍රබෝධනය සඟරාව පිළිබඳව උන්වහන්සේ තුළ ඇති උනන්දුව අත් නොහළේය. මාසිකව තමන් වෙත ලැබෙන සඟරාව කියවන්නට උන්වහන්සේ තුළ වූ ප්‍රිය මනාපය සිරිතක් විය.

පසු ගිය දිනක අපෙන් සමුගත් දයාබර පියතුමන්ගේ ආත්මයට දෙව්ඳු වාස භවනයෙහි සදා මහිමය ප්‍රාර්ථනා කරමු.

**- රූපස් ෆ්‍රැන්සිස් -**

**වසංගතයට පසු.....** 7 වන පිටුවෙන්.....


උත්පත්ති කතාවේ ඒවගේ සහ ආදම්ගේ ප්‍රතිචාරය වරද අන් අය පිට පැවරීම යි. එය එසේ නොවිය යුතුය. අපේ වරද පිළිබඳ වගකීම අපි බාර ගනිමු.

දිව්‍ය පූජාවේ ආරම්භයේ දී කතෝලික අප ප්‍රසිද්ධියේ අපගේ වරද වෙන අය පිට පවරන්නේ නැතිව අපි ම බැහැපත්ව බාර ගනිමු. මාගේ වරදින් යැ යි කියමින් එසේ කරමු. මේ වසංගතයෙන් පස්සෙ අපට අවශ්‍යවන්නේ වසන්තයකි. ඒ වෙනුවෙන් වෙනස් නොවන්නේ නම් අපට ඉතුරු වන්නේ වසන්තයක් නොව ව්‍යසනයකි.

**- මතු සම්බන්ධයි -**

## තෙවෙනි ඇස

### විශ්වීය දෙව් දහමක් වෙත





# කොවිඩ් 19 හා පරිසරය

කොවිඩ් - 19 කොරෝනා වයිරසය හේතුකොට ගෙන මුළු ලොවම මාස කීපයකට නතර වුණා, කම්හල් වැසී ගියා, නගර ජන ශූන්‍ය වුණා, රථවාහන ධාවනය නතර වුණා, මිනිස් ක්‍රියාකාරකම් ඇණ හිටියා.

නොනැවතී දුවන මහ දැති රෝදයක් වන වෙළඳපොළ ලිබරල් ධනවාදී සමාජ ආර්ථික ක්‍රමයට විරාමයක් ලැබෙද්දී නොනැවතී දූෂණයට ලක්වෙමින් පැවැති පරිසරය සුවපත් වෙන්නට ගත්තා. කාර්මික විප්ලවය ආරම්භ වුණාට පසු මෙලෙස මේ ප්‍රමාණයට ආර්ථික යාන්ත්‍රණය ඇණ හිටියේ ප්‍රථම වරට. මේ නිසා කාබන් විමෝචනය විශාල ලෙස අඩුවුණා. ඉතාලියේ හා ස්පාඤ්ඤයේ 23%, චීනයේ 24%, අසල්වැසි ඉන්දියාවේ 24% ක් මේ නිසා වායු ගෝලයේ දූෂිත අංශු අවම වී පිරිසිදු වුණා.

කම්හල්වලින් පිටවන අපද්‍රව්‍ය, අපජලය අවම වූ නිසා ගංගා පවිත්‍රභාවයට පත්වුණා. ලංකාවේ දූෂිතම ගංගාව වන කැලණි ගඟේ වතුර බීමට හැකි තරමට පවිත්‍ර වුණා.

නමුත් කොවිඩ් සමය තුළත්, වනාන්තර කපා දැමීම, නීති විරෝධී ආකර කැණීම, පස්වැලි කැණීම් ආදි ජාවාරම් ලොව දස දෙසින් වාර්තා වුණා.

**පූර්ව කොවිඩ් සමය (BC) හා පරිසරය**

කෙසේ වෙතත් යහපත් වෙනස්වීම අපට, ලොවට තදින් දැනුණේ කොවිඩ් - 19 පෙර සමය තුළ මුළු ලොවම මුහුණ දී සිටින අංක එකේ ප්‍රශ්නය බවට පරිසර ප්‍රශ්නය පත් වී තිබුණ නිසයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ වසර ආරම්භ වෙද්දී 'බරපතළ පාරිසරික හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කොට තිබුණා. **ශ්‍රී ලංකාව ලෝකයේ පාරිසරික අවදානම් වැඩිම රටවල් තුන අතර ලැයිස්තු ගත වී තිබුණා.**

දේශගුණික වෙනස්කම් හා ගෝලීය උෂ්ණත්වය ඉහළයාම නිසා පූර්ව කොවිඩ් යුගය තුළ ලෝකය පැවැතියේ වහාම වෙනස් නොකළහොත් පෘථිවියේ පැවැත්ම අහෝසි විය හැකි බරපතළ තත්ත්වයකය. මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන පසුගිය වසර 50 තුළ කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) ප්‍රතිශතය 318PPM සිට 400PPM පමණ දක්වා වැඩි වීම එක් නිදසුනක් පමණයි. පරිසර වායු දූෂණය නිසා වාර්ෂිකව සිදුවන මරණ මිලියන ගණනක් වුණා. එසේ වුවද ඇමරිකා එක්සත් ජනපදය, ජපානය වැනි රටවල් කාබන් විමෝචනය අඩු කිරීමේ ගෝලීය සම්මුතිවලින් ඉවත්වෙමින් හිතුවක්කාර ලෙස තම ආර්ථිකය ගැන පමණක් හිතන ක්‍රියාමාර්ගවල නිරත වුණා.

ඇමසන් ගිනි ගැනීම්, ලැව්ගිනි පමණක් නොව අහස් ගිනි හා සාගර ගිනි ව්‍යාප්ත වෙමින් තිබුණා. පෘථිවි උෂ්ණත්වය ඉහළ යාම සියල්ල සාරාංශ කරන දර්ශකයයි.

**"වර්තමාන තත්ත්වය වහා අත්හැර නොදැමුවහොත් මනුෂ්‍ය වර්ගයා මහත් විනාශයට මුහුණ දෙනු ඇත. තත්ත්වය කොතරම් බැරෑරුම් හා දුරදිග ගොස් ඇත්දයත් විසඳුමක් සඳහා මනුෂ්‍ය සංහතිය සතු සියලුම ආර්ථික භෞතික, විද්‍යාත්මක හා තාක්ෂණික සම්පත් ඒ සඳහා යොමු කිරීම අවශ්‍ය වී තිබේ"** යැයි නික් බිම්ස් නම් විචාරකයා කළ ප්‍රකාශය තුළ පූර්ව කෝවිඩ් යුගයේ පරිසර අර්බුදය සාරාංශ ගත වේ.

**පශ්චාත් කොවිඩ් (AC) සමය හා පරිසරය**

කොවිඩ් සමඟ පරිසරය කිසියම් දුරකට සුවපත් වූ බවක් දකින්නට ලැබීම පරිසර හිතවාදීන්ගේ සැනසුමට හේතු වුවත් එය පශ්චාත් කොවිඩ් සමය තුළ ඵලදායී වෙනසක් ලෙස ඉදිරියට පවත්වාගත හැකි ද? ඒ සුවපත් බව පරිසරය පසුගිය කාලය තුළ මුහුණ දුන් දරුණු විනාශයක් සකස් කිරීමට ප්‍රමාණවත් ද ? යන ප්‍රශ්නය නැගුවොත් පරිසරවේදීන්ගේ මතය වන්නේ අවමාන බව හා ප්‍රමාණවත් නොවන බවයි.

දේශගුණික වෙනස්කම් හා ගෝලීය උෂ්ණත්වය ආපසු හැරවීමට තරම් කොරෝනා තත්ත්වය තුළ ඇති වූ සහනය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. අනිත් අතට කොරෝනා තත්ත්වයෙන් පසු වැටුණු ආර්ථිකය යළි ගොඩනැගීමට වඩාත් ඉහළ ප්‍රයත්නයන් දැරීම තුළ තිබුණාටත් වඩා තත්ත්වය නරක්වීමටද පුළුවන් බව විද්‍යාඥයෝ අනතුරු අඟවති.

ලෝක ජනගහනයෙන් වැඩි පිරිසක් සමකයට ආසන්න කලාපය තුළ ජීවත් වෙති. ගෝලීය උෂ්ණත්වය තවත් සෙල්සියස් 40% ක් පමණ බරපතළ අර්බුදයකට ලක්වනු ඇත.

ඔවුන්ගේ ප්‍රධාන ආහාර භෝග වගා කළ නොහැකි තත්ත්වයක් හෝ බරපතළ ලෙස සීමාවන තත්ත්වයක් ඇති වීම මඟින් උග්‍ර ආහාර අර්බුදයකට මුහුණ දීමට සිදුවනු ඇත.

දරාගත නොහැකි උෂ්ණත්වය මත විවිධ රෝග මඟින් මිය යන පිරිස ඉහළ යනු ඇත. පසුගිය දශකය තුළ විශේෂයෙන් සමකයට ආසන්න රටවල උෂ්ණත්වය දරාගත නොහැකිව සිදුවූ මරණ රාශියක් වාර්තා වූ බව අප අමතක නොකළ යුතුය.

පශ්චාත් කොරෝනා යුගය තුළ තිරසර කර්මාන්ත, තිරසර රැකියා, ගැන දැඩි අවධානය යොමු කළ යුතු අතර පරිසරය රැකීම පිළිබඳ ගෝලීය සම්මුති වඩාත් පුළුල්ව හා ස්ථිරසාර ලෙස ක්‍රියාවට නැංවීම උනන්දු කළ යුතුව ඇත.

හැකි තරම් දුරට ෆොසිල ඉන්ධන භාවිතය අඩු කිරීමටත් වෙනත් පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවයක් භාවිත කිරීමටත් රටවල් හා පුද්ගලයන් තීරණය කළ යුතුය.

ඒ සඳහා පරිසර හිතකාමී ආකල්ප වර්ධනය කළ යුතු පරිසර හිතකාමී ජීවන ශෛලියක් පවත්වා ගත යුතුය.

පරිසර සංරක්ෂණයෙහිලා වඩාත් බාධාකාරී වන දැවැන්ත බහුජාතික සමාගම්වලට බලපෑම් කිරීම අප ඉදිරියේ ඇති අභියෝගයකි. ඒ සඳහා ගෝලීය සහයෝගිතාවක් වර්ධනය කරගත යුතුය.

කොරෝනා කාලය තුළ පරිසරයට අහිතකර පුරුදුවලින් අත්මිදුණු තැන් ඉදිරියට පවත්වාගත යුතුය.

**කොවිඩ් හා සොබාදහමේ දෙවි දහම**

කොවිඩ් සමය තුළ අපගේ අවධානය යොමුවන ප්‍රධාන දේව ධාර්මික ඉගැන්වීම වන්නේ, සබත් දිනය, සබත් වසර හා ජුබිලි වසර පිළිබඳ දේව

ධර්මයයි. මිනිසාට පමණක් නොව ගහකොළ, සතා සිව්පාට මහ පොළවට විවේකයක් දිය යුතු බවට වන දේව යාච්ඤාවේ ගැඹුරු සහජීවනයේ රිතියකි. එය නික්මයාම **20/8-11 ලෙවි 25/3-7 ලෙවි 25/11** ආදී ශුද්ධ ලියවිලි පාඨ මගින් කදිමට විස්තර කර ඇත. අධිපරිභෝජනවාදී ආර්ථික හා සංවර්ධන ආකෘතිය මේ නිවාඩු දීම අහෝසි කර සොබාදහමද මිනිසාද සූරාකමින් ගිය ගමන ගැන සිතීමට කොවිඩ් කාලය සලකුණ අපට ආරාධනා කරයි.

**කිතුනු ප්‍රතිචාරය කෙබඳු විය යුතුද ?**

පූර්ව කොවිඩ් 19 සමය තුළ පරිසරය පිළිබඳ කිතුනු දූත සේවාව ගැන ප්‍රැන්සිස් සුදුතුම් පියතුමාත් විකල්ප ධාරාවේ කිතුනු ක්‍රියාකාරිනුත් ඉතා පැහැදිලි දැක්මක් හා සුභාවිතයක් යෝජනා කරමින් හා භාවිතයට ගනිමින් තිබිණ.

අවාසනාවට නිල වශයෙන් සභාවත්, කිතුනු සංඝ පාරිසරික හදිසි තත්ත්වය තම කිතුනු ජීවිතයේ ප්‍රමුඛතාවක් බවට පත් කරගත්තේ නෑ.

මේ ලියුම්කරු 2020 ආරම්භයේදී සියලුම රදගුරුවරුන් වෙත ලිපියක් ලියමින් ශ්‍රී ලංකාව තුළ සියලු කතෝලික පදවි හා ප්‍රධාන ධාරාවේ කිතුනු සභා එක්ව පාරිසරික වසරක් ප්‍රකාශයට පත් කර පාරිසරික දූත කාර්යය වෙත යොමුවක් ඇති කරන ලෙස ඉල්ලා සිටියා.

ප්‍රැන්සිස් සුදතුම් පියතුමාගේ "වේ ප්‍රශංසා" විශ්ව චක්‍ර ලේඛනයට වසර 5 ක් පිරීම නිමිත්තෙන් එතුමා මැයි 16-24 කාලය තුළ ද වේ ප්‍රශංසා සතියක් ප්‍රකාශයට පත් කළා. එහෙත් ඊට කොවිඩ් තත්ත්වය තුළ වුවද උපරිම දායකත්වයක් දීමට ක්‍රියා කළ බවක් පෙනුණේ නෑ.

මැයි 24 වනදා සුදුතුම් පියතුමා "වේ ප්‍රශංසා" වසරක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. එකී වසර ක්‍රියාත්මක කිරීමට නිල තීරණයක් ගැනීමට ලංකාවේ කිතුනු සභාවලට හැකිනම්, කිතුනු සංවිධානවලට හැකිනම්, කොවිඩ් 19 කාලය තුළ සොබාදහම තුළින් ඇසුණු දෙවිඳු කටහඬට අප අවනත වූවා වේ.

පෘථිවි ගෝලය රැක ගැනීම හෙවත් පරිසරය රැක ගැනීම පිළිබඳ ඇත්තේ ඒ සඳහා හැකියාවක් නැතිකම නොවේ. මානව වර්ගයා සතුව ඕනෑවටත් වඩා සම්පත් හා හැකියාව තිබේ. නැත්තේ අවංක වුමනාවකි.

අන්තර්ජාතික බලශක්ති ඒජන්සිය 2012 දී ඇස්තමේන්තු කළ ආකාරයට බලශක්ති ක්ෂේත්‍රයේ පරිසර හිතකාමී වෙනස්වීම් කිරීමට අවශ්‍ය මුදල වාර්ෂිකව ඇමරිකානු ඩොලර් බිලියන 10-100 ක ප්‍රමාණයකි. එය 2011 දී ඇමරිකාව ඇෆ්ගන් යුද්ධයට වැය කළ මුදලට වඩා අඩුය. ඇමරිකාවේ ධනවත්ම දස දෙනාගේ වත්කම්වල එකතුවෙන් තුනෙන් එකකට වඩා අඩුය.

**මහින්ද නාමල්**

# අරුම විරාමය

*මනු නෙතඟින් රූස්සා ඔච්චම් කළ*
*අනාත්ම ආත්මයක්දෝ මේ*
*හෝහපුටු වෙසින් ගොදුරු කරගත්*
*විසල් දැනුමට ගෝචර නොවූ බවකි හැඟෙන්නේ*

*විරාම ලකුණක් දෝ විස්මයාර්ථයක් කැටුව*
*දුහුල් සළුවක ඉඩකි විරාමයක් කැන්දා*
*හිත නිවන ගිම්හානයකි මනු ලොවට*
*අතීතාවර්ජනයකට එබිකම් කරන්නට*

*වසත් කලක් දෝ මේ කඳු අතරින් කඩා හැලෙන්නේ*
*තණ පියසි පිනිමල්වලින් සරසා*
*අහසේ සියොත් රැඟුම් සලන්නේ*
*හිරු කුමරුන් මිහිකතට ආල පාන හෝරාවේ*

*ස්වේත වලා දුවයි සිසිල කර පින්නා අක්ෂාංශ පුරා*
*බිඟුතුඩේ රොන් ඉත සිහින් රිංගාගෙන*
*අහස් කුස පුරා රවුම් ගසන්නේ*
*පෙර නොදුටු රසඳුන් තබා හද සන්තානේ*

*පැවරුම් පාඩමකි ඒ නිමේෂේ අපට දුන්*
*දෛවයේ පවන් රැළට හසුවුණ මනු මල් කෙමි*
*ගුවනින් ගිලිහෙන බර්ති පිනිබිඳුවලට හිස නමයි*
*ඒ පවන් රැළටම හසු වී යයි නිදැල්ලේ*

**ගරු නිර්මිත සුරවීර නි.ම.නි. සහෝදරතුමා**
නි.ම.නි. දෙව්සත්හල, අම්පිටිය.

# ඕං එහෙනං



කොරෝනා යක්ෂයා ගොරවන විලසින් ලෝකෙ පුරා සක්මන් කරතෙයි
ලක්ෂ ගණන් ජීවිත බිලි වෙන්නේ දවසට දහසක් ගණන් හැදෙයි
මිනි වළලන්නට ඉඩ මදි හන්දා සමූහ වළවල් එක දිගට කැපෙයි
ලෝක යුද්දෙටත් වැඩියෙන් මිනිසුන් නැසුවේ කොරෝනා වසංගතෙයි

ලෝකෙට ලොක්කෝ බලගතු ඇත්තෝ පස්ස බිම ඇනන් චප්ප වෙතෙයි
රටවල් වැසෙති දොරගුලු දමති මාස ගණන් අඳුරේ නීති වැටෙයි
මහලොකු ලෙඩක් යැ හෙම්බිරිස්සාවයි කැස්ස උණ ගැනෙයි උගුරේ රිදිල්ලද ඇඟට දැනෙයි
මේකට බෙහෙතක් තාම සොයා නැත හඳ අල්ලන්නට නම් කතා වෙතියි

කතා මිසක් වැඩ නැති උන්ගේ කටවල් වහලා හරි කදිමයි
වස විස දුන් නැති ලෝකය සුද්දයි මිහිකත සැනසුම් සුසුම් හෙළයි
දෙවිඳුන් මැවූ ලොව හරිම සුන්දරයි ඒ වග අමතක කරපු නිසයි
දෙවියන් දුන්නේ පුදුම දඬුවමක් දැන්වත් ඒ ටික සිතනු යසයි

කතා බහක් නැති පියාට පුතු නැති අම්මට දුව නැති කාලයකයි
කන්න වෙලා නැති ඉන්න වෙලා නැති දිව්වේ කාසිය මත්තේමයි
සියල්ල කනපිට මව් පිය දූ දරු ආච්චි සීයලා එක වහලක් යට යසට සිටියි
කන්න නැතත් බොල එක පවුලක් ලෙස දුක සැප බෙදුණේ කොරෝනිකා නිසයි

රට ගිය ඇත්තෝ පණ බේරාගෙන මෙහාට ආවේ ලෙඩ්ඩු වගෙයි
නිරෝධායනය දෙන්නට යන කල පිප්පුවේ හරියට පිස්සො ලෙසයි
සිංහල අමතක ඔලුගෙඩි ඉදිමුණු ඒ ඇත්තන් ගැන නම් හරිම දුකයි
රට රකිනා විරු සුව දෙන ඉසිවරු සේවය මහමෙර තරම් වටියි

කොරෝනා පහ වී යනවා එක්කම කතිර පොරේ දැන් එළිපත්තෙයි
මනාප ඉල්ලා වඳිනවා දැක්කම අනේ අපොයි බඩ පපුව දැවෙයි
රට කන්නට දත් තිස්දෙක දැක්කම භයංකරයි මහසෝනා වගෙයි
දියවන්නා නැති පාඩුව නොපෙනේ මෙහෙම ගියොත් නම් රට සරු වෙයි

**සූරිය මාමා - ජෝසප් ඩයස්**

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය






කොරෝනා වසංගතය නිසා මාස ගණන් පාසල් වැහිලා. පාසල් දරුවන් නිවෙස්වලට කොටු වී සිටිති. සෙල්ලමක් කරන්නටවත් ගෙදරින් එළියට යවන්නේ නෑ. ඒකාකාරී ජීවිතය දරුවන්ට තිත්ත වෙලා. ගෙවල් ඇතුළේ පුදුම යුද්ධයක්. අම්මලට මහ හිසරදයක්. ගහන්ඩ යෑ, බණින්ඩ යෑ, තරහ ගියාම ඩිංගක් හයියෙන් කෑ ගහනවා. සමහර වෙලාවට පහරක් දෙකක් නොදුන් වෙලාවලුත් නැතුව ඇති.

හැම ගෙදරකම මේ ප්‍රශ්නය නැතුවා නොවේ. හැබැයි කොරෝනා නිසා එක හොඳක් සිද්ධ වුණා. පවුලේ හැමෝම ගෙදරට වෙලා ඉන්න ලැබීම. තාත්තලා දරුවෝ එක්කල සෙල්ලම් කරනවා. අම්මා එක එක කෑම ජාති හදලා දෙනවා. ආච්චිලා සීයලා මුනුබුරු මිනිබිරියන්ට කතන්දර කියල දෙනවා. ඒ හැමටම වැඩියෙන් වැදගත්ම දේ තමයි, හවස් වෙනකොට පවුලේ හැමෝම එකතුවෙලා යාච්ඤා කරන එක. මිනුලගෙ සීයාට දැන් අවුරුදු හැත්තෑපහක් විතර ඇති. ආච්චියි සීයයි ඉන්නේ මිනුලගෙ ගෙදර. මිනුලට නංගිලා දෙන්නෙක් ඉන්නවා. මිනුල ඉගෙනුම ලබන්නේ නවය වසරේ. මිනුලගෙ වත්තේ හොඳට ඉඩකඩ තියනවා. සීයාත් ගොවිතැන්වලට ආසයි. කොරෝනා දවස් වල සීයාත් එක්ක එකට එකතු වෙලා මිනුල පුංචි ගෙවතු වගාවක් පටන් ගත්තා. දැන් එළවළු ජාති වලින් මුළු වත්තම පිරිලා. උදේට හවසට සීයත් එක්ක එකතු වෙලා පැලවලට පොහොර දානවා. වතුර දානවා. වල් නෙලනවා. දැන් පලදාවත් ඇවිල්ලා. දැන් හැමෝටම සතුටුයි. මිනුල කියන්නේ පාසල් පටන් ගත්තත් ගෙවතු වගාව අත් නොහරින බවයි.

ආදර පුංචි පුතේ, කොරෝනා වසංගතෙන් අපට පාඩම් ගොඩක් කියා දුන්නා. පරිසරය දූෂණය නොකළොත් සොබාදහම කොච්චර ලස්සණද කියල කියා දුන්නා. සිදුරු වෙලා තිබුණු ඕසෝන් ස්තරය යථා තත්ත්වයට පත්වුණා. අපේ රටේ බොහෝ තැන් වලට ශ්‍රී පාද කන්ද පෙණුනා. කැලණි ගඟේ ජලය  නිල් පැහැ ගැන්වුණා. කොළඹ නගරයේ ගස්වල මල් පිපුණා. ඒ හැමෝටම වැඩිය පවුලක් ලෙස අපි හැමෝම එකට ජීවත් වුණා. තම ගෙවත්තේ මොනව හරි පැලයක් හිටවන්නට අපි පුරුදු වුණා. හොඳ සෞඛ්‍ය පුරුදු පිළිපැද්දා විතරක් නෙවෙයි ඉදිරියේ දී පිළිපදින්නත් පුරුදු වුණා. ඉතින් කොරෝනා තිබුණත් නැතත් මේ හොඳ පුරුදු අපේම ජීවිතේ කොටසක් කර ගනිමු.

**සූරිය මාමා**

## ප්‍රහේලිකා අංක - 59



**පහළට**

1. මිහිකත යන්නෙන් හඳුන්වනු ලබන්නේ.
2. මුල් අගුණ පව් වලින් එකකි.
4. සිංහල යන අර්ථය දේ.
5. කාලයට ඔබින ලෙස සැකසීම.
8. පේරාදෙණිය ප්‍රදේශයේ නගරයකි.
9. තහනම යන්නට නව අදහස් දේ.
10. විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් සකසන ලද ග්‍රන්ථයකි.
11. අග සහ මුල අතර පිහිටා ඇත.
12. පංච ඉන්ද්‍රියයන්ගෙන් දැනෙනා එක් සංවේදනයකි.
14. පෙරහැරේ මුලින්ම ගමන් කරන්නෝ ඊගෙන යති.
16. මැදුර යන්නට සම අර්ථය දේ.
18. තායිලන්තයට කියන තවත් නමකි.
19. මෙමඟින් මුදලද, මිතුරාද යන දෙකම නැතිවේ.

**හරහට**

1. සිංහල ක්‍රමයට අනුව මාසයකි.
3. බැබිලෝනියානු වාසයෙන් පසු ඊශ්‍රායෙලය ගොඩ නැඟීමට එස්රා සමඟ කටයුතු කළේ
6. ඉතා දිග
7. හංවැල්ල ප්‍රදේශයේ ගමකි.
10. ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණය
15. නිර්මල මරිය නිකායික පියවරුන් හඳුන්වන තවත් නමකි.
17. බලාපොරොත්තුවෙන් සිටින තැනැන් වහන්සේ
20. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රමුඛ ආණ්ඩුව හැඳින්වූ තවත් නමකි.
21. සන්දේශ කාව්‍යයකි.

**සැකසුම :**
**ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා,**
**මීසම් සේවක, ඇඹිලිපිටිය.**

### ප්‍රහේලිකා අංක 57 ජයග්‍රාහකයෝ

- **පළමුවන ස්ථානය** - ඔනාර ඩිහෙන් බොතේජු
  5 ශ්‍රේණිය,
  හල/වෙන්/ වැකඩ මහා විද්‍යාලය,
  වැකඩ, යෝගියාන.
- **දෙවන ස්ථානය** - M.N.S. දිව්‍යාංජලී
  13 ශ්‍රේණිය, කුලි/මධ්‍ය විද්‍යාලය, කුලියාපිටිය.
- **තෙවන ස්ථානය** - රන්දිල් චමිඳු මෙන්ඩිස්
  9D ශ්‍රේණිය,
  සා. සෙබස්තියන් විදුහල, උයන පාර,
  මොරටුව.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, **2020 අගෝස්තු 31 ට** පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයින් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවලින්, රු.1000.00, රු. 750.00, රු. 500.00** බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල හා නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.

**ප්‍රහේලිකා අංක - 59**
**"ළමා ප්‍රබෝධනය".**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

# අවිනිශ්චිත වර්තමානයක හා අනාගතයක ජීවත්වන ඔබට... මට...

වයස් භේදයකින් තොරව අපි හැම කෙනකුම පාහේ අඩු වැඩි වශයෙන් තාමත් කිසියම් අවිනිශ්චිතතාවක් අත්දකිමු. මේ හේතුව නිසා අප තුළ කාංසාජනක තත්ත්වයක්, බයක් හෝ ඉච්ඡා භංගත්වයක් තවම පැවතිය හැකිය. අප සැලසුම් කර තිබූ වැදගත් බොහොමයක් දේ අවලංගු වී ඇත. ඇතැම් දෑ දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදු වුණි. දෛනික කටයුතු බොහොමයක් තවමත් ඇණහිට ඇත. මේ හේතු නිසා අනාගතය අදටත් අපැහැදිලිය. පාසැල් යළි විවෘත වන දින නියම කළත් එය කෙසේ කෙලෙස සිදු කළ හැකිද යන්න දැඩි නොසන්සුන්කමක් දෙමාපියන් හා ගුරුවරුන් තුළ හට ගෙන ඇත. උසස් පෙළ විභාගයේ විෂය නිර්දේශය සම්පූර්ණ නොකර විභාගය පැවැත්වීම කෙතෙක් දුරට යුක්තිසහගතද යන්න අද ශිෂ්‍ය ශිෂ්‍යාවෝ, ගුරුවරු සහ දෙමාපියෝ කතා බහට ලක් කරති. සැබවින්ම සිසුවෝ සිසුවියන්ට මානසික ආතතිය ගෙන එන ප්‍රශ්නයකි මෙය.

නව කොරෝනා වසංගතයට හේතු සාධක වූ COVID-19 වයිරසය මැඩලීම සඳහා මෙතෙක් සාර්ථක ඖෂධයක් සොයාගෙන නැත. මේ වසංගතය හේතුවෙන් ලොව පුරා සිදු වන දෛනික මරණ සංඛ්‍යාවේ ද පැහැදිලි අඩුවීමක් තවම වාර්තා වී නොමැත. කෙදිනක මේ වසංගතය ලොවින් පහ වේ දැයි සහතික කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය පවා අපොහොසත් වී ඇත. නව කොරෝනා වසංගතයට තමා හෝ තම පවුලේ උදවිය ගොදුරු වෙතැයි පැවති බිය හා සැකය බොහෝ අය කෙරෙන් තවමත් පහව ගොස් නොමැත. මාස දෙකක් වැනි කාලයක් තුළ ඇඳිරි නීතිය හේතුවෙන් ගෙවල්වල සිරවී, කොටුවී සිටි අත්දැකීම කෙසේවත් ප්‍රසන්න නොවේ. මේ නුහුරු නුපුරුදු අත්දැකීම අප තුළ දැඩි ආතති තත්ත්වයක් ගෙන දෙන්නක් විය. ස්වාමි පුරුෂයන් හා බිරින්දෑවරුන් නිවෙස් තුළ වෙනදාට වඩා වැඩි කාලසීමාවක් එකට වාසය කිරීම මේ තත්ත්වය යටතේ අනිවාර්ය වූ හෙයින් පවුල් ආරවුල් වැඩි වර්ධනය වූ අතර ඇතැම් ගැටුම්කාරී තත්ත්ව ගෘහස්ථ හිංසනයන් දක්වා දිගහැරුණු බවට වාර්තා වේ. මේ කොරෝනා වසංගතය හේතුවෙන් රැකියා අහිමි වූ පිරිස් ද විවිධ ආදායම් මාර්ග අහිමි වූ අයද වැටුපෙන් කොටසක් අහිමි වූ අයද සිටිති. එමෙන්ම, බොහෝ පවුල්වල ආර්ථිකය පිරිහී ගොස් ය. මේ හේතුව නිසා අත්‍යවශ්‍ය දෑ පවා සපුරා ගත නොහැකි තත්ත්වයකට ඇතැම් පිරිස් පත්ව සිටිති.

මේ අනුව බොහෝ දේ අවුල් සහගත විය, පිළිවෙලක් නැති විය. "දෙවි කෙනෙක් ඉන්නවද?", "දෙවියෝ කොහෙද?" ලෙස ඇතැම් අය දෙවියන් වහන්සේගේ වැඩසිටීම හා උන්වහන්සේගේ සාධාරණත්වය ප්‍රශ්න කරන්නට වූහ. තම සිහින බලාපොරොත්තු බොඳවන කල්හි ජීවිතවල වටිනාකම සම්බන්ධව ඇතැම් අයට ප්‍රශ්න මතුවිය. ඉතාලිය, ප්‍රංශය හා ඇමරිකාව වැනි රටවල දවසකට මිනිසුන් දහස් ගණනින් මියයන විට හා මහපාරවල් අයිනේ ගොඩගැසෙන මළ කඳන් දකින විට තවත් අය මිනිස් ජීවිතයේ තේරුම කුමක්දැයි ප්‍රශ්න කරන්නට යෙදුණි. එහෙත් මේ හැම දෙයක්ම යථාර්ථයේ එක පැත්තක් පමණි. එය අශුභවාදී ය. එහෙත් යථාර්ථයේ තව පැත්තක් ඇත. අප සමස්තය දැකිය යුතු වෙමු. මේ ලිපිය කියවන ඔබ බොහෝවිට කොරෝනා රෝගයට ගොදුරු වී නොමැත. ඒ දේව කරුණාව නොවේද? අමාරුවෙන් හෝ ඔබට පසුගිය මාස දෙක තුනේ බඩට යමක් දාගන්නට හැකි වුණා නොවේද? සමහර විටක හාමතේ සිටි අයකුට ඔබ ළඟ තිබුණු සොච්චමින් පවා යමක් දෙන්නට තරම් ඔබ කාරුණික වන්නට ඇති. අසරණයන් වෙනුවෙන් සමාජ මෙහෙවරක නිරත වෙන්නට ඔබ උත්සාහ කරන්නට ඇති. මෙවන් අවිනිශ්චිත තත්ත්වයක් තුළ ඔබ සිටිය ද ඉන් ඔබ්බට යන්නට ඔබ තුළ ක්‍රියාත්මක වූයේ දේව ආදරයයි.

මේ විශේෂ අත්දැකීම හරහා දෙවියන් වහන්සේ අපට අනිවාර්යයෙන්ම කිසියම් පාඩමක් ඉගැන්වීමට උත්සාහ කරන බවක් පෙනේ. ඒ වැදගත් පාඩම අපි ඉගෙනගත යුතු වෙමු. එයට අවධානය දිය යුතු වෙමු. එය නොසලකා හැරීම අප

අතින් සිදුවිය හැකි බරපතළ අතපසුවීමක් විය හැකිය. එනිසා උන්වහන්සේම අප එකිනෙකාට කතා කරන හඬට සවන් දෙමු. අපට නුපුරුදු ඒ නිහඬතාවට ඇතුළු වෙමු. ඇතැම් විට අප සිතනුයේ නව කොරෝනා වසංගතය දෙවියන් වහන්සේ අප වෙත පැමිණ වූ දඬුවමක් ලෙස ය. දෙවියන් වහන්සේ අපට දැඩි දඬුවම් දීමට මාන බලමින් සිටින අයෙක් නොවේ. පලිගැනීම උන්වහන්සේගේ ස්වභාවය ද නොවේ. උන්වහන්සේ අපගේ ආදරණීය පියාණන් වහන්සේය. උන්වහන්සේගේ අතින් මිදී අපි අපේ සිතැඟියා ඔස්සේ ගමන් කළෙමු. වැරදුණේ මෙතනය. අපි දේව සැලැස්ම සහ ස්වභාවධර්මයට පිටුපා ආත්මාර්ථකාමී ලෙස ජීවත් වූවෙමු. අපි දැන් අතරමංවී අනතුරු අබියස සිටිමු. අප කළයුතු වන්නේ "නැවත හැරී" **උන්වහන්සේ වෙත පැමිණීමය. මෙතෙක් අප ජීවිතයේ ප්‍රමුඛතාව දුන්නේ වෙනත් පුද්ගලයන්ට හා වෙනත් දේවලට විය හැකිය. වෙනසක් සිදුවිය යුතු නොවේද? ජීවිතයේ තේරුම ඇත්තේ උන්වහන්සේ තුළ ය. මිනිස් අපේ ප්‍රශ්නවලට විසඳුම ඇත්තේ ද, අපට අවශ්‍ය ආරක්ෂාව, සැනසීම හා සුවය ඇත්තේ ද, උන්වහන්සේ තුළ පමණක්ය. අවදානම් තත්ත්වයන් තුළ වුව ද උන්වහන්සේ සමග අප සිටින්නේ නම් බියවීමට කිසිදු කරුණක් නොමැති බවට ක්‍රිස්තුස් වහන්සේ එදා තම ගෝලයන්ට චණ්ඩමාරුතය දමනය කරමින් පැවසූ සේක (මාර්ක් 4:35-41).**

ශුද්ධ වූ බයිබලය පුරා සඳහන් වනුයේ දෙවියන් වහන්සේ අපට දක්වන ආදරය හා සැලකිල්ල සම්බන්ධවය. මනුෂ්‍යයන් ලෙස අවිනිශ්චිත වාතාවරණයක් තුළ අපි කාංසාජනක තත්ත්වයට පත් වෙමු. එය ස්වාභාවිකය. එහෙත් ඉච්ඡාභංගත්වයට පැමිණ අන්ත අසරණ භාවයක් තුළ රැඳී සිටීම කතෝලික අපට නොගැලපේ. ක්‍රිස්තුන් වහන්සේ අපෙන් ඉල්ලා සිටිනුයේ **"කුමක් කමු ද?, කුමක් බොමු ද? කියා ජීවිතය ගැන වත්, කුමක් අඳිමු ද? කියා ශරීරය ගැනවත් වුවමනාවට වඩා කරදර නොවන ලෙසය (මතෙව් 6:25).** උන්වහන්සේ මෙසේ පවසන්නේ දෙවියන් වහන්සේ අප සම්බන්ධව දක්වන සැලකිල්ලේ අපරිමිත භාවය හේතුකොට ගෙනය. අප නිතර කරදර වන ආහාර සම්බන්ධව උන්වහන්සේ පැවසුවේ මෙවන් දෙයකි. **"අහසේ කුරුල්ලන් දෙස බලන්න. උන් වපුරන්නේ වත්, කපන්නේ වත්, අටුවල රැස් කරන්නේ වත් නැත. එහෙත්, ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ උන් පෝෂණය කරන සේක. ඔබ ඔවුන්ට වඩා බොහෝ සේ වටිනවා නොවේද? (මතෙව් 6:26). දෙවියන්වහන්සේ අප කෙරෙහි දක්වන සැලකිල්ල තවදුරටත් තහවුරු කරමින් "ඔබේ හිසකෙස් සියල්ල පවා ගණන් කොට ඇත. බිය නොවන්න" (ලූක් 12:7) යැයි පවසන සේක. "එබැවින් හෙට දවස ගැන කරදර නොවන්න" (මතෙව් 7:34)** ලෙස උන්වහන්සේ අපට පොරොන්දුවක් දෙන සේක. අපි ඒ පොරොන්දුව අයිති කරගනිමු. විශ්වාසයෙන් යුතුව අනාගතයට මුහුණ දෙමු . එක තැන ඇණහිටි අප ජීවිත අපි යළි පණ ගන්වමු. නව කොරෝනා වසංගතය අප ජීවිත වලට අභියෝගයක් වුවද එය වඩා යහපත් දෙයක් උදාකර ගැනීම සඳහා අවස්ථාවක් කර ගනිමු (convert a threat to an opportunity). ඒ හරහා නව අහසක් හා නව පොළොවක් උදාකර ගනිමු.

**නිහාල් සහ ශ්‍යාමලී යුවල,**
දළුගම.



# කතෝලික ධර්මය
## අ.පො.ස. ( සා/පෙළ ) විභාගය - 2020
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පූජකවරයෙහි පූර්ණත්වය හිමිවන්නේ,
 1. තේවාචාරී ධුරයට 2. රාජගුරු ප්‍රසාදි ධුරයට 3. පූජා ප්‍රසාදි ධුරයට 4. අගරදගුරු ධුරයට

2. පැවිදි ජීවිතයේ ලක්ෂණ වන්නේ,
 1. කීකරුකම, දිළිඳුකම, ව්‍රත ශුද්ධිය 2. රාජකීය, පූජක, දිවැසි කාර්‍යය
 3. කීකරුකම, ප්‍රේමය, සමාවදීම 4. විශ්වාසය, බලාපොරොත්තුව, දේව ප්‍රේමය

3. ආශිර්වාදකාර බන්ධනය දානය කිරීමේ දී සභාවේ නිල සාක්ෂිකරුවා වන්නේ,
 1. විවාහ වන යුවල 2. දිව්‍ය පූජාවට සහභාගිවන ජනතාව
 3. දෙමාපියන් 4. පූජාප්‍රසාදිතුමාය

4. "අපි විප්ලව නොකරමු. විප්ලවය අපිම වෙමු " යන ආදර්ශ පාඨය අයත් වන්නේ,
 1. මරිය හමුදාව 2. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය
 3. ධර්ම දූත ළමා සමාජය 4. ළ.ක්‍රි.වි. සමාජය

5. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණයක් නොවන්නේ,
 1. ගිවිසුමකි 2. යාගයකි 3. භාවනාවකි 4. භෝජනයකි

6. "ප්‍රසාද නිධානයන්ගේ ප්‍රසාද නිධානය" ලෙස හඳුන්වනු ලබන්නේ,
 1. දිව්‍ය පූජාව 2. ආශිර්වාදකාර බන්ධනය
 3. රෝගීන්ගේ ආලේපය 4. දිව්‍ය සත්ප්‍රසාදය

7. මිසර වාසීන් වෙත පැමිණි පළමු හා අවසාන වසංගතය වන්නේ,
 1. වතුර ලේ වීම - මැසි උවදුර 2. වතුර ලේ වීම - ගනදුර උවදුර
 3. වතුර ලේ වීම - ගල් වර්ෂාව 4. වතුර ලේ වීම - කුලුඳුලන් මැරීම

8. මිසරයේ වහලුන්ව සිටි ජනතාව කළ කර්මාන්ත වන්නේ,
 1. කුඹල්, ගඩොල් , කෘෂිකර්මාන්ත වේ. 2. කුඹල් , ධීවර, කෘෂිකර්මාන්ත වේ.
 3. කුඹල්, ගොඩනැගිලි, පේෂකර්මාන්ත වේ. 4. කුඹල් , ධීවර , පේෂකර්මාන්ත වේ.

9. "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානය ආරම්භ කළේ,
 1. ෆ්‍රැන්ක් ඩෆ් මහතා 2. අති උතුම් ලියෝ ජෝසප් කානල් තුමා
 3. ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා. 4. ශු. තෙරේසා මුනිතුමිය

10. ආලේප කිරීමෙන් සංකේතවත් වන්නේ කුමක්ද?
 1. කිතුනුවකු සේ ශක්තිමත් කිරීම. 2. දේව විශ්වාසයයි. 3. පිරිසිදු භාවයයි. 4. ආදරයයි.

11. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන නම් ඇතුළත් පිළිතුරු බණ්ඩය වන්නේ,
   1. පාපෝච්චාරණය / අන්තිම ආලේපය
   2. සිත් හැරීමේ දේව ප්‍රසාද නිධානය / රෝගීන්ගේ ආලේපය
   3. සමාව දානය කිරීමේ දේව ප්‍රසාද නිධානය / පශ්චාත්තාපයේ දේව ප්‍රසාද නිධානය
   4. පශ්චාත්තාපයේ දේව ප්‍රසාද නිධානය / පූජකවරය.

12. දිවැසිවර කාර්යයේ දූත සේවාව කුමක්ද?
   1. ධර්මෝපදේශයය 2. ධර්ම දානයයි 3. ප්‍රේමයයි. 4. ආදරයයි.

13. දේව මාතාවන්ගේ මධ්‍යස්ථකම තුළ ක්‍රියාත්මක වන ප්‍රබල ගිහි අපෝස්තලික සේවාව කුමක්ද?
   1. දේව මාතා දරුසමාගම 2. ධර්මදූත ළමා සමාජය 3. කිතුදන පුබුදුව 4. මරිය හමුදාව

14. ඉතා දිළිඳු අසරණ අයට දයා ප්‍රේමය දක්වන පිණිස ගොඩනංවා ඇති අපෝස්තලික සේවාව කුමක්ද?
   1. සාන්ත විසෙන්තිද පාවුලා සමිතිය. 2. සාන්ත ජෝන් ගිලන්රථ හමුදාව
   3. ගැලවීමේ හමුදාව 4. දිව්‍ය හෘදයේ සමිතිය

15. දිව්‍ය රහස් කරන අවස්ථාවේ ලන්චියානෝ නුවර දේවස්ථානයේදී සිදුවුයේ කුමක්ද?
   1. මිදිරස වතුර බවට පත්වීම. 2. පූපය පිටි බවට පත්වීම.
   3. පූපය මස් කැබැල්ලක් බවට පත්වීම. 4. ජලය මිදි යුෂ බවට පත්වීම.

16. මෝසෙස්ගේ තනියට පාරාවෝ වෙත යැවීමට දෙවියන් වහන්සේ තෝරා ගත්තේ කාවද?
   1. ජොෂුවා 2. ආබ්‍රහම් 3. ජෝසප් 4. ආරොන්

17. ජුදා පාස්කු මංගල්‍යයේ මූලිකාංග අන්තර්ගතවී ඇති පිළිතුර,
   1. නුමුහුන් පූප / ජලය 2. තිත්තපලා / මිදියුෂ
   3. තිත්තපලා / ධාන්‍ය 4. පාස්කු බැටළුවා / මන්නා.

18. 1920 දී පෝලන්තයේ උපත ලද කැරොල් වොයිටිල්ලා යනු කව්ද?
   1. ශුද්ධ වූ II ජුවාම් පාවුලු මුනිතුමා 2. ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
   3. ශුද්ධ වූ 23 වන ජුවාම් මුනිතුමා 4. අති උතුම් ලියෝ ජෝසප් කාදිනල් තුමා

19. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණක් වන්නේ,
   1. කල්වාරි යාගය 2. සකරියස්ගේ යාගය 3. මෙල්කිසදෙත්ගේ යාගය 4. ජෝසප්ගේ යාගය

20. කල්කටාවේ ශුද්ධ වූ තෙරේසා මුනිතුමිය ආරම්භ කළ පැවිදි නිකාය වන්නේ
   1. දිළින්දන්ගේ කුඩා සොයුරියෝ 2. සුරදූත පැවිදි නිකාය
   3. අසරණ සරණ දූතිකාවෝ 4. දයාවේ දූතිකාවෝ

---

**පිළිතුරු :**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1) -2 | 4) -2 | 7) -4 | 10)- 1 | 13) -4 | 16) -4 | 19) -3 |
| 2) -1 | 5) -3 | 8) -1 | 11) -3 | 14) -1 | 17) -2 | 20) -4 |
| 3) -4 | 6) -4 | 9) -3 | 12) -2 | 15) -3 | 18) -1 | |

---

**ඉදිරිපත් කිරීම :- ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය.**

ආචාරිනී : මිනුවන්ගොඩ / ශ්‍රී ඥානෝදය ම.ම.වි. දිවුලපිටිය.

## ලක්දිව ක්‍රිස්තු ශාසනය ( IX )

**අ.පො.ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය - ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.**

### ලක්දිව කතෝලික සභාවේ වර්ධනය

පෘතුගීසි පාලනය ආරම්භ වීමත් සමඟ ලක්දිව කිතු සසුන 1534 දී පිහිටවුණු ගෝව රදගුරු වසමට අයිති විය. ඉන්පසු 1558 සිට කොචින් රදගුරු පදවියට අනුයුක්ත කර තිබුණි. 1834 දී XVI වන ග්‍රෙගරි පාප්තුමා ලංකාව ස්වාධීන විගාරි වසමක් කෙළේය. ඉන්දීය ඔරතෝරියානුවකු වූ වින්සෙන්ති ද රොසයිරෝ පියතුමා එහි ප්‍රථම විගාරි තනතුරට පත්විය. එතුමාගේ ඇවැමෙන් 1843 දී තවත් ඔරතෝරියානුවකු වන කයිතානෝ අන්තෝනියෝ පියතුමා විගාරි තනතුරට පත් කරන ලදී. ක්‍රි.ව. 1845 ජෝසප් බ්‍රාවි පියතුමා ප්‍රමුඛ සිල්වෙස්ත්‍රි බෙන්දිකානු නිකාය ලංකාවට සැපත් විය. 1845 දී ඔරාසියෝ බෙටාකීනි පියතුමා ලංකා විගාරි වසමේ යුව රදගුරු විය. මෙතුමා ලක්බිමේදී රදගුරු අභිෂේකය ලත් ප්‍රථමයා විය. පෙරකී රදගුරුවරුන් අභිෂේකය ලැබුවේ ඉන්දියාවේදීය. රදගුරු අභිෂේකයෙන් පසුව එතුමා ප්‍රංශයේ මාර්සෙල්ස් නුවර ගොස් එහි රදගුරු නිර්මල මරිය නිකායේ නිර්මාතෘ ශු. එවුජින් ද මැසනොඩ් හිමිපාණන් හමු විය. එහිදී බෙටාකීනි හිමිතුමා ඒ රදගුරුතුමාගෙන් ඉල්ලා ඇත්තේ ලක්දිවට නිර්මල මරිය නිකායික ධර්මදූතවරුන් එවන ලෙස ය. පසුව ඉතාලියට ගිය බෙටාකීනි රදගුරුතුමා එහිදී සිල්වෙස්ත්‍රීන බෙනදිකානු නිකායේ අධිපති එමිලියෝ මිලියානි රදගුරුතුමා හමු වී ලක්දිවට ඒ නිකායේ ධර්මදූතවරුන් එවන ලෙස ද ඉල්ලා සිටියේය. ක්‍රි. ව. 1847 නොවැම්බර් 28 දින බෙටාකීනි රදගුරුතුමා නැවත ලක්දිවට පැමිණෙන්නේ යුරෝපීය ධර්මදූත වරුන් සමඟ ය.

### නිර්මල මරිය නිකාය

මේ නිකායේ ධර්මදූතවරුන් ලක්දිවට පැමිණියේ ක්‍රි.ව.1847 දීය. කණ්ඩායමේ 4 දෙනෙකි. නායකයා වූයේ ස්ටීවන් සෙමරියා පියතුමා ය. එතුමා යාපනය ප්‍රදේශයේ ධර්මදූත කටයුතු බාරව ක්‍රියා කළේය. ක්‍රි.ව. 1856 දී ඒ නිකායේ ප්‍රධාන පූජකතුමකු වූ ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා පැමිණියේය. අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශාල සේවාවක් කළ මෙතුමා ක්‍රි.ව. 1868 දී යාපනය විගාරි වසමේ රදගුරු විය. 1883 දී කොළඹ විගාරි වසමේ රදගුරු විය.1886 දී ලංකා රදගුරු මණ්ඩලය පිහිටුවීමත් සමඟ 1886 කොළඹ ප්‍රථම අගරදගුරු විය. කොළඹ හා යාපනය පදවිවල ඉංග්‍රීසි අධ්‍යාපනය නගා සිටුවීමට සුවිශාල මෙහෙවරක් එතුමන්ගේ මඟ පෙන්වීම යටතේ සිදු විය. කොලරා වසංගත රෝගය වැළඳුණ රෝගීන් වෙනුවෙන් ඇපඋපස්ථාන කිරීම ද මේ නිකායෙන් සිදු වූ සුවිශේෂී මෙහෙවරකි.

කතෝලික ධර්මදූත පියතුමන්ලාගේ ආරාධනය මත 19 වන සියවසේ දී හා පසුව ලක්දිවට කාන්තා පැවිදි පංති පැමිණියහ. ඒ අනුව,

- ශුද්ධවූ පවුලේ සොහොයුරියෝ ක්‍රි.ව. 1862 ඔක්තෝබර් 19 දින ද,
- යහපත් එඬේරාගේ සොහොයුරියෝ නිකාය ක්‍රි.ව. 1869 මැයි මස 01 දින ද,
- මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන සොහොයුරියෝ ක්‍රි. ව. 1886 මාර්තු 06 වන දින ද,
- අපෝස්තලික කාර්මෙල් සොහොයුරියෝ ක්‍රි.ව. 1922 පෙබරවාරි 05 වන දින ද,
- දේව ආරක්ෂාවේ සොහොයුරියෝ ක්‍රි.ව. 1948 මැයි 18 වන දින ද,
- සදාසරණ සොහොයුරියෝ ක්‍රි.ව. 1929 දී ද,
- දොමිනිකාන සොහොයුරියෝ ක්‍රි.ව. 1954 ඔක්තෝබර් 7 වන දින ද ලක්දිව සේවයට පැමිණියහ.

### සිල්වෙස්ත්‍රීන බෙන්දිකානු තාපස නිකාය

ක්‍රි. ව. 1845 ජෝසප් බ්‍රාවි පියතුමන්ගෙන් සහ එතුමන් සමඟ පැමිණි ග්‍රාෂියා, ඔරුනා යන පියවරුන්ගෙන් මේ නිකායේ සේවය ලක්දිව ආරම්භ විය. නිකායේ නිර්මාතෘ ඉතාලියේ සිල්වෙස්ටර් ගොසොලිනි පියතුමා. එතුමා ඉතාලියේ මොන්ටෙෆානෝ තාපස ව්‍යවස්ථාව ආදර්ශයට ගෙන තම නිකායේ ව්‍යවස්ථාව ස්ථාපිත කළේය. ක්‍රි.ව. 1863 - 1878 කාලයේ දී ජෝසප් බ්‍රාවි පියතුමන්ගේ උපදෙස් පරිදි ඒ නිකායේම හිලේරියන් සිල්ලානි රදගුරුතුමා දකුණු පලාතේ ප්‍රතිරාජගුරු වසම පාලනය කළේය. යහපත් එඬේරා නිකායේ පැවිදි සොහොයුරියන් ලක්දිවට ගෙන්වා ගැනීමට මෙතුමා පුරෝගාමී විය. මෙතුමන්ගේ මඟපෙන්වීම යටතේ කතෝලික සිංහල පුවත්පත වන "ඥානාර්ථ ප්‍රදීපය" 1866 දී ආරම්භ කරනු ලැබීය.

ක්‍රි.ව. 1886 වන විට 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා විසින් ලක්දිව පදවි 3ක් ලෙස වෙන් කර ඇත. ඒ අනුව යාපනය හා කොළඹ නි.ම.නි. රදගුරුතුමන් යටතේ හා මහනුවර බෙන්දිකානු නිකායික

රදගුරුතුමන් යටතේ පාලනය විය. ලක්දිව අගරදගුරු පදවිය ලෙස කොළඹ පදවිය නම් කෙරිණි. ක්‍රි.ව. 1869 දී "කැතලික් මැසෙන්ජර්" පුවත්පත ද, ක්‍රි.ව. 1899 දි "භක්ති ප්‍රබෝධනය" සඟරාව ද ආරම්භ විය.

### ශුද්ධවූ පවුලේ නිකාය

ගරු පීටර් බියෙන්වෙනු නොආයි පියතුමන් විසින් ක්‍රි.ව. 1820 මැයි මස 28 වන දින මේ නිකාය ආරම්භ කළේය. ක්‍රි.ව. 1862.10.19 දින දී යාපනයේ රදගුරු ස්ටීවන් සෙමරියා හිමිපාණන් විසින් ශුද්ධවූ පවුලේ නිකායට දූත කටයුතු භාර කරන ලදී. ඒ නිකාය ධර්මදූත කටයුතුවලට අමතරව ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා පාසල් ආරම්භ කර පවත්වාගෙන යෑම සිදුවිය.

### යහපත් එඬේරා නිකාය

මේ නිකාය මේරි යුප්‍රේසියා තුමිය විසින් ක්‍රි.ව. 1835 අප්‍රේල් මස 03 වන දින ප්‍රංශයේ දී ආරම්භ කර ඇත. නොමග ගිය තරුණියන් සුමගට ගැනීම නිකායේ අරමුණ විය. දකුණු රදගුරු පදවිය භාර හිලේරියන් සිල්ලානි හිමි තුමාගේ ඉල්ලීමකට අනුව මේ නිකාය ක්‍රි.ව. 1869 පෙබරවාරි මස ලක්දිවට පැමිණියේය.

### සුරදූතික නිකාය

ගාල්ල රදගුරු ජෝසප් වැනරිත් හිමිපාණෝ විසින් දේශීය පැවිදි නිකායක් ලෙස ක්‍රි. ව. 1903 ජනවාරි 15 වන දින ඒ නිකාය ගාල්ලේ දී ආරම්භ කළෝය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉපැරණි දේශීය කාන්තා පැවිදි පන්තිය ඒ නිකාය වේ.

### ආධාර ලබන පාසල්

ඒ පාසල් ආරම්භ කිරීමේ පුරෝගාමියා ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් නි.ම.නි. පියතුමාය. මෙතුමා හැම විටම තම සේවා කාලය අධ්‍යාපනය සඳහා කැප කළේය. බ්‍රිතාන්‍ය රජය අධ්‍යාපන කටයුතු පවත්වා ගෙන යන ලද්දේ එංගලන්ත සභාවේ දේව ගැතිවරුන් විසිනි. ඒ අධ්‍යාපනය බොහෝ දුරට රෙපරමාදු හුරුවකට හැඩගැසී තිබුණි. ක්‍රි. ව. 1856 දී ලක්දිවට පැමිණි බොන්ජීන් පියතුමා දුටුවේ රජයෙන් කතෝලික පාර්ශ්වයට අධ්‍යාපනය පිළිබඳ සැලකිල්ලක් නොමැති බවය. ඒ නිසා රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය එතුමා තදින් විවේචනයට ලක් කළේය. ඉන් පසුව එතුමන් රජයට යෝජනා කරන ලද්දේ හැම කිතුනු සභාවකටම පොදු වූ තම දහම උගන්වන පාසල් ක්‍රමයක් ඇති කරන ලෙස ය. එතුමා තවදුරටත් පෙන්වා දුන්නේ දරුවකු ගෙදරදී මෙන්ම පාසලේදී ද ආගම සම්බන්ධ අධ්‍යාපනයක් ලැබිය යුතු බවයි. එනිසා සියලුම ආගම්වලට පාසල් පවත්වා ගැනීමට ඉඩ තිබිය යුතු බවත් රජය එබඳු පාසල් වලට මුදලින් ආධාර කළ යුතු බවත් ය. ඒ යෝජනාව රජය විසින් ක්‍රියාත්මක කරන ලදදේ ආකාර දෙකකට ය.

- සියලු ආගම්වලට ඒ ආගමේ දරුවන් සඳහා පාසල් පිහිටුවා ගැනීමට අවසර ලබා දීම.
- සතුටුදායක අධ්‍යාපනයක් ලබා දෙන එබඳු පාසල්වලට රජය මුදලින් ආධාර ලබා දීම.

මේ ප්‍රතිපත්ති නිසා උපකෘත පාසල් ක්‍රමය ආරම්භ විය. ඒ අනුව ආගමික නිකාය විසින් පාලනය වන රජයේ ආධාර ලබන පාසල් ක්‍රමයක් බිහි විය. ඒ ක්‍රමය ආගමික උපකෘත පාසල් ලෙස හැඳින්වේ. උපකෘත නම් උපකාර කරන ලද යනුයි.

### ක්‍රිස්ටෝප් බොන්ජීන් නි.ම.නි. පියතුමා

ක්‍රි.ව. 1823 සැප්තැම්බර් 3 දා උපත ලැබීය. ක්‍රි.ව. 1846 පූජකවරය ලබා ඉන්දියාවේ කොයම්බුක්කූර් නගරයට පැමිණ සේවයේ යෙදුණි. ක්‍රි.ව. 1856 දී ලක්දිවට පැමිණ යාපනයේ සේවය කළේය. ලක්දිව උපකෘත පාසල් බිහි කිරීමට පුරෝගාමී වූයේ ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා ය. ක්‍රි.ව. 1869 දී පවත්වන ලද 1 වන ජගත් වතිකාන කතිකාවට යාපන කලාපය වෙනුවෙන් ලංකාව නියෝජනය කළේය. ඒ කතිකාවේ නිර්දේශ මත යාපනයේ ශාන්ත මාටින් දෙව්සත්හල දේශීය පූජක පුතුන් බිහි කිරීම සඳහා ක්‍රි.ව. 1869 දී ආරම්භ කළේය. එය ප්‍රථම කතෝලික දෙව්සත්හල වේ. ක්‍රි.ව. 1876 දී යාපනයේ පළවන "පදුකාවලන්" නැමති දමිළ කතෝලික පුවත්පත ආරම්භ විය. කොළඹ සාන්ත බර්නාඩ් දෙව්සත්හල, සාන්ත ජෝසප් විදුහල, කොළඹ මහ රෝහලේ සේවය සඳහා මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන ධර්මදූතික පැවිදිවරියන්ගේ සේවය, නොයෙක් ප්‍රදේශ වලින් පැමිණෙන බැතිමතුන් සමඟ එක්වී ක්‍රි.ව. 1870 සිට පවත්වන ජූලි මස මඩු මාතා, තලවිල සාන්ත ආනා මංගල්‍ය මෙතුමාගේ සේවා අතර ප්‍රධාන වේ. ස්වභාෂා පාසල් ආරම්භ කිරීම කරන කොට ගෙන ක්‍රි. ව. 1883 වන විට ස්වභාෂා පාසල් ගණන වැඩි වී 107 දක්වා වර්ධනය වී තිබුණි. නිර්මල මරිය නිකාය පියවරුන් විසින් පවත්වාගෙන යනු ලබන මග්ගොන කාර්මික විද්‍යාලය ක්‍රි.ව. 1884 දී ආරම්භ විය. කතෝලික සභාවට සුවිශාල සේවයක් කළ නිර්මල මරිය නිකායික ඒ රදගුරුතුමා ක්‍රි. ව. 1892 දී ස්වර්ගස්ථ විය.

**සටහන - එස්. හේමාල් පෙරේරා**

# ආයේ හෙට දවසක් තියේවිද අද වාගේ ?

**ස්තුතියි අපව සසල කළාට**

අප සිතනවාට වඩා විශාල බලවේගයක් මත අප හැම යැපෙන වග මතක් කර දුන්නාට ස්තුතියි.

**ස්තුතියි ඇති කළ කම්පනයට**

සශ්‍රීකබව, නිදහස, සෞඛ්‍යය බහුලව තිබියදීත් අප ඒ ගැන එතරම් සැලකිලිමත් වී නොමැති වග මතක් කර දුන්නාට ස්තුතියි.

**ස්තුතියි හදිසි විරාමයට**

මූලික දේවලට කාලය නොයොදවා, අපගේ කාර්ය බහුලත්වය තුළ අප සිරවී ඇති වග මතක්කර දුන්නාට ස්තුතියි.

**ස්තුතියි අපව එක්තැන් කළාට**

ඉතා වැදගත් යයි සිතූ සියලු දේ පසක ලා සැබවින්ම වැදගත් වන දේ ගැන යොමු වන්නට ඉඩ සැලසුවාට ස්තුතියි.

**ස්තුතියි ගමනාගමනය නතර වුණාට**

වායු දූෂණය ගැන අවධානය යොමු කරනු මැන යනුවෙන් මිහිකත නොකඩවා මොරදුන් හඬට සවන් දෙන්නට මතක් කළාට ස්තුතියි.

**ස්තුතියි බිය සන්ත්‍රාසයට**

දිගු කාලයක සිට ගෝලීය රෝගයක් බවට පත්ව තිබූ ඒ චකිත ස්වභාවයට මුහුණ දෙන්නට අපව යොමු කළාට ස්තුතියි.

**ස්තුතියි තාවකාලික බවට**

අවසානයේ ලොව ඇති ආරක්ෂිතම ස්ථානය තමන්ගේ සුන්දර නිවස හා ආදරණීය පවුල බව ඉගැන්නුවාට ස්තුතියි.

**ස්තුතියි තනිකම පාළුවට**

එහෙත් හුදෙකලා නොවිය යුතු වගක් මතක් කර දුන්නාට ස්තුතියි.

**ස්තුතියි මර බියට**

සියලු මනුෂ්‍යයන්ට ඇත්තේ එකම පැහැ ඇති රුධිරය සහ සමාන මර බියක් බව තේරුම්ගන්නට සැලැසුවාට ස්තුතියි.

**ස්තුතියි අපව එකතු කළාට**

ලෝකය වෙනස් විය යුතු වග කියා පෑමට, අප සැම එක ශරීරයක අවයව බව අපට නැවත මතක් කර දුන්නාට ස්තුතියි.

**ස්තුතියි අද දවසට**

සියල්ල අවබෝධ කරගන්නට අවකාශය සලසමින් මුල සිටම ලෝකය නැවත ගොඩ නගන්නට අවස්ථාව දුන්නාට ස්තුතියි.

**ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියනම**

අදියුරු, සා. ඇලෝසියස් දෙව්සත්හල, බොරැල්ල.

# කුරුණෑගල ජෝසප් වාස් උසස් අධ්‍යාපන ආයතනය

මෙහෙයවනු ලබන



# ද්වි මාසික නේවාසික ඉංග්‍රීසි පාඨමාලාව



ව්‍යාකරණ, කතනය, භාෂා උච්චාරණය, ලිවීම, සවන්දීම පිළිබඳව
ප්‍රමාණවත් දැනුම් සම්භාරයකින් සිසු සිසුවියන් සන්නද්ධ කරවන
**ද්වි මාසික පූර්ණ ඉංග්‍රීසි පාඨමාලාව සමගින්:**

සදාචාරාත්මක පැවතුම් සහ යහපත් පෞරුෂත්වයකින් සිසු සිසුවියන්ගේ ජීවිත හැඩගන්වීම සඳහා:

- Emotional Intelligence
- Presentation Skills
- Soft Skills
- Counseling
- Social Etiquettes
- Leadership Training

**දේශන මෙහෙයවීම: කතෝලික පූජාප්‍රසාදීවරුන්, කන්‍යා සොහොයුරියන් සහ ප්‍රවීන කථිකාචාර්යවරුන්**




පාඨමාලා ආරම්භය 2020 ජූලි සහ සැප්තැම්බර්
පන්නල IHFC මධ්‍යස්ථානයේදී

**විමසීම්:** Very Rev.Fr.Sagara Prishantha Perera - Director :
Joseph Vaz Institute , St.Anne's Street, Kurunegala
Mobile: 071 70 300 77 | Fixed: 037 2223961 |
Web:www.jvi.lk | Email:director@jvi.lk

Joseph Vaz Institute




"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. Q/D/03/පුවත්/2020